වාර්ෂික වාර්තාව හා ගිණුම්

2022

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

අනුරාධපුර.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

දැක්ම

ආසියාවේ ථේරවාද බෞද්ධ උසස් අධ්‍යාපන ආයතන අතර ප්‍රමුඛත්වයට පත්වීම.

මෙහෙවර ප්‍රකාශය

බෞද්ධ දර්ශනය, පෙර අපර දෙදිග භාෂා අධ්‍යයනය ඇසුරින් තුලනාත්මකව ලබා ගත්, ධර්ම ශාස්ත්‍රීය හා ප්‍රායෝගික ඥානයෙන් හෙබි ථේරවාද සම්ප්‍රදායානුගත ප්‍රබුද්ධ විද්‍යාර්ථීන් පිරිසක් බිහි කිරීම.

විශ්වවිද්‍යාලයේ පරමාර්ථ

1. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම.

2. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර බෞද්ධ භාවනාව පිළිබඳව පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

3. ථෙරවාද බුද්ධධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම.

4. බුද්ධධර්මය හැදෑරීමට සහ ඒ පිළිබඳව පර්යේෂණ කිරීමට ධෛර්යය දීම.

5. බෞද්ධ සංස්කෘතිය සහ එහි අගයන් ප්‍රවර්ධනය කිරීම.

6. ඉහත සඳහන් පරමාර්ථවලට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් කවර වුවද දෙයක් කිරීම.

අතිගරු මහෝපාධ්‍යායයන් වහන්සේගේ පණිවුඩය



1968 අංක 16 දරන පනතින් අනුරාධපුර මහමෙවුනා උයනේ ආරම්භ කරන ලද බුද්ධශ්‍රාවක ධර්ම පීඨය මෙම විශ්වවිද්‍යාලයේ මූලාරම්භයයි. එය කාලීන අවශ්‍යතා සැලකිල්ලට ගෙන 1996 අංක 26 දරන පනතින් බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය ලෙසත්, 2012 අංක 15 දරන සංශෝධිත පනතින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය ලෙසත් වසර 52 ක උරුමයක් ඇති මෙම විශ්වවිද්‍යාලය මගින් මේ දක්වා ජාතික හා ජාත්‍යන්තරව කීර්තියට පත් ධර්ම-විනය ධර භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් බිහිකර ඇත. දකුණු ආසියාවේ භික්ෂූන් වහන්සේලාට පමණක් වෙන් වූ එකම විශ්වවිද්‍යාලය ද මෙය වේ.

බුද්ධශාසනය ආරක්ෂා කර පෝෂණය කිරීමට දැන උගත් පරිපූර්ණ භික්ෂූන් වහන්සේලා බිහිකිරීම ප්‍රධාන අරමුණු කොට පිහිටුවා ඇති මෙම විශ්වවිද්‍යාලයේ සියලුම උපාධි පාඨමාලා බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව සකස් කර ඇත. මෙම විශ්වවිද්‍යාලයේ සියලුම අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් විසින් **බෞද්ධ දර්ශනය** විෂය හැදෑරීම අනිවාර්ය වේ.

විශ්වවිද්‍යාල ඉතිහාසය තුළ බලයට පත් වූ සියලුම රජයන්ගේ පූර්ණ අනුග්‍රහය මත විශ්වවිද්‍යාලයේ උත්තරීතර සභාව, පාලක සභාව, සනාතන සභාව මෙන්ම මේ දක්වා සේවයේ නියුතු ගරු මහෝපාධ්‍යායයන් වහන්සේලාගේ මග පෙන්වීමෙන් ද අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කැපවීමෙන් ද මෙම විශ්වවිද්‍යාලය අංග සම්පූර්ණ පරිපූර්ණ බෞද්ධ විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය වෙමින් පවතී.

මෙම විශ්වවිද්‍යාලය මගින් ක්‍රියාත්මක ප්‍රථම උපාධිය සඳහා පසුගිය වසර තුළ ලියාපදිංචි ව ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 154 කි. 2021 වර්ෂයේ සිට විදේශීය භික්ෂූන් වහන්සේලා සඳහා මෙම විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දී ඇති අතර උන්වහන්සේලාට නේවාසික පහසුකම් සැලසීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් අති නවීන නේවාසිකාගාරයක් ඉදිකර ඇත.

මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු **බෞද්ධ අධ්‍යයන** හා **භාෂා හා සංස්කෘතික අධ්‍යයන** පීඨ දෙක යටතේ ඇති අධ්‍යයන අංශ 04 මගින් සිදු කරනු ලබයි. තවද පශ්චාත් උපාධි බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය මගින්ද ඒ සඳහා අවශ්‍ය සහය ලබා දේ. විශ්වවිද්‍යාලයීය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 154 කි. අධ්‍යයන කාර්ය මණ්ඩලය අතර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ ආචාර්ය උපාධිධරයන් ද සිටීම අධ්‍යයන හා පර්යේෂණ කාර්යයන්හි ගුණාත්මක භාවය ඉහළ නැංවීමට හේතු වී ඇත. එකී මානව සම්පත් මෙන් ම අංග සම්පූර්ණ පුස්තකාලය, නවීන උපාංග සහිත දේශන ශාලා, පරිගණක විද්‍යාගාර, නේවාසිකාගාර ආදි භෞතික සම්පත්වලින් ද මෙම විශ්වවිද්‍යාලය පරිපූර්ණ වේ.

2022 වර්ෂය තුළ උපාධි අපේක්ෂකයින්ගේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙම විශ්වවිද්‍යාලයට හැකි විය. ඒ සඳහා සහාය දැක් වූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කැපවීමත්, සිසුන්ගේ අනුකූලතාවත් ඉතා අගය කොට සලකමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්ථවිර
මහෝපාධ්‍යායයන් වහන්සේ

පටුන

විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය ---------- i

පරමාර්ථ ---------- ii

අතිගරු මහෝපාධ්‍යායයන් වහන්සේගේ පණිවුඩය ---------- iii

1. උත්තරීතර සභාව, පාලක සභාව හා සනාතන සභාව

1.1 උත්තරීතර සභාව - ---------- 1

1.2 පාලක සභාව - ---------- 2

1.3 සනාතන සභාව - ---------- 3

1.4 රැස්වීම් - ---------- 4

2. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යූහය - ---------- 5

3. ශිෂ්‍ය කටයුතු

3.1 ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා නව ඇතුළත්වීම් (දේශීය) ---------- 6

3.2 ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා නව ඇතුළත්වීම් (විදේශීය) ---------- 7

3.3 උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ---------- 7

3.4 අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ---------- 7

3.5 ප්‍රථම උපාධි පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව ---------- 8

3.6 පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා පිළිබඳ විස්තර ---------- 8-9

3.7 ශිෂ්‍ය නේවාසිකාගාර පහසුකම් ---------- 9

3.8 මහපොළ ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර ---------- 10

3.9 වෙනත් ශිෂ්‍යත්ව ---------- 10

4. මානව සම්පත්

4.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය ---------- 11-12

4.2 අනධ්‍යයන කාර්ය මණ්ඩලය ---------- 12-13

4.3 පසුගිය වසර 05 තුළ තථ්‍ය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ---------- 14

5. පර්යේෂණ හා සංවර්ධනය

5.1 පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන ---------- 15-21

5.2 අධ්‍යයන පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු ---------- 22

6. පුස්තකාලයීය කාර්ය සාධනය

6.1 පුස්තකාලය සතු ග්‍රන්ථ සංචිතය ---------- 23

6.2 විඥාපන සම්පත් ---------- 23

6.3 පුස්තකාල පරිහරණය හා සාමාජිකත්වය ---------- 23

6.4 පුස්තකාලයෙන් නිකුත් කරන ලද පොත් ---------- 23

6.5 ගාස්තු අයකර ගැනීම් ---------- 23

7. මූල්‍ය කාර්ය සාධනය

7.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර ---------- 24

7.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර ---------- 24

7.3 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත) ---------- 24

7.4 ව්‍යාපෘති වියදම පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත) ---------- 24

7.5 යටිතල පහසුකම් පිළිබඳ විස්තර ---------- 25

7.6 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) ---------- 25

7.7 මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2022 ---------- 25

8. තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව ---------- 26

9. 2022 වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව හා පිළිතුරු ---------- ඇමුණුම 01

10. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ - 2022 ---------- ඇමුණුම 02

1. උත්තරීතර සභාව, පාලක සභාව හා සනාතන සභාව

1.1 උත්තරීතර සභාව - 2022

නිල සාමාජික

1. **මහාමහෝපාධ්‍යායයන් වහන්සේ - සභාපති,** ශ්‍යාමෝපාලි මහානිකායේ මල්වතු පාර්ශවයේ මහානායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් වහන්සේ
2. **මහෝපාධ්‍යායයන් වහන්සේ,** ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
3. ශ්‍යාමෝපාලි වංශික මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශවයේ මහානායක අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන මාහිමිපාණන් වහන්සේ
4. ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක දොඩම්පහල චන්දසිරි මාහිමිපාණන් වහන්සේ
5. ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ මහානායක අතිපූජ්‍ය අග්ගමහාපණ්ඩිත ශාස්ත්‍රපති මකුලෑවේ විමල මාහිමිපාණන් වහන්සේ
6. අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම සිරිසුමන ධම්මරක්ඛිත සිරිනිවාස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.11.18 දක්වා)

   අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම හේමරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.12.08 සිට)

අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයින්.

7. ආචාර්ය අතිපූජ්‍ය ඉත්තෑපානේ ධම්මාලංකාර මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
8. අතිපූජ්‍ය ත්‍රිකුණාමලේ ආනන්ද මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
9. අතිපූජ්‍ය මැදගම ධම්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
10. අතිපූජ්‍ය නුගේතැන්නේ පඤ්ඤානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
11. අතිපූජ්‍ය අංකුඹුරේ පේමවංස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
12. මහාචාර්ය බී. ඒ. කරුණාරත්න මහතා
13. එච්.එම්.පී. බණ්ඩාර මහතා

ලේඛකාධිකාරි - ලේකම්

14. යූ. ඩී. දොඩන්වල මහතා

1.2 පාලක සභාව - 2022

නිල සාමාජික

1. **මහෝපාධ්‍යායයන් වහන්සේ - සභාපති,** ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
2. **පීඨාධිපති - බෞද්ධ අධ්‍යයන පීඨය**, ආචාර්ය පූජ්‍ය කඩවත්ගම පියරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
3. **පීඨාධිපති - භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය,** පූජ්‍ය ගල්වැවේ විමලබන්ති ස්වාමීන්ද්‍රයන් වහන්සේ
4. මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා - **ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** (2022 මැයි මස දක්වා)

   සෝමරත්න විදානපතිරණ මහතා, **ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** (2022 මැයි මස සිට)
5. ටී. බී. එම්. අතපත්තු මහතා, **අතිරේක ලේකම් (පාලන හා මුදල්), උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට**
6. ආර්. එම්. විජේසිංහ බණ්ඩා මහතා, **අධ්‍යක්ෂ (සුභ සාධක), මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට** (2022.02.25 දින දක්වා)

   එච්. හේමාල් කස්තුරිආරච්චි මහතා, **අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික කටයුතු අංශය), මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට** (2022.02.26 දින සිට)

සනාතන සභාව විසින් පත් කළ සාමාජිකයින්

7. පූජ්‍ය කිරම විමලතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ, **අංශාධිපති, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය**
8. පූජ්‍ය උඩුගම්පල ගුණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ, **අංශාධිපති, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය**

අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයින්

9. ආචාර්ය පූජ්‍ය නියංගොඩ විජිතසිරි අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
10. පූජ්‍ය නැදගමුවේ විජයමෛත්‍රී අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
11. සම්මානිත මහාචාර්ය පූජ්‍ය කන්දෙගොඩ විමලධම්ම අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
12. මහාචාර්ය පූජ්‍ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
13. ආචාර්ය පූජ්‍ය ගොඩගම මංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
14. මහාචාර්ය පී. විල්සන් මහතා
15. ආර්. එම්. වන්නිනායක මහතා
16. බී. කේ. ජේ. කාවන්තිස්ස මහතා (2022.09.20 දින දක්වා)
17. සම්මානිත මහාචාර්ය ගාමිණි සේනානායක මහතා (2022.10.21 දින සිට)

ලේඛකාධිකාරී - ලේකම්

18. යූ. ඩී. දොඩන්වල මහතා

1.3 සනාතන සභාව - 2022

මහෝපාධ්‍යායයන් වහන්සේ - සභාපති

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පීඨාධිපතිවරු

2. ආචාර්ය පූජ්‍ය කඩවත්ගම පියරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, බෞද්ධ අධ්‍යයන පීඨය
3. පූජ්‍ය ගල්වැවේ විමලබන්ති ස්වාමීන්ද්‍රයන් වහන්සේ, භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය

අධ්‍යයන අංශාධිපතිවරු

4. පූජ්‍ය කිරම විමලතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය
5. පූජ්‍ය කහටගස්දිගිලියේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ, ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය
6. පූජ්‍ය උඩුගම්පල ඉණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය
7. පූජ්‍ය බලදොර ඉන්දජෝති ස්වාමීන්ද්‍රයන් වහන්සේ, භාෂා අධ්‍යයන අංශය

මහාචාර්යවරු

8. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය පාතේගම ඤාණිස්සර ස්වාමීන්ද්‍රයන් වහන්සේ, බෞද්ධ අධ්‍යයන පීඨය
9. ප්‍රමුඛ මහාචාර්ය පූජ්‍ය කනංගමුවේ රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේ, භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය

පීඨ නියෝජිතවරු

10. ආචාර්ය පූජ්‍ය දිවුලපැලැස්සේ විමලානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ, බෞද්ධ අධ්‍යයන පීඨය
11. පූජ්‍ය බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.03.03 දින සිට), බෞද්ධ අධ්‍යයන පීඨය
12. පූජ්‍ය කරඳගොල්ලේ විපිතතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ, භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය
13. පූජ්‍ය කුඩාවැවේ සෝමානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.03.03 දින සිට 2022.08.24 දින දක්වා), භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය

    ආචාර්ය පූජ්‍ය උඩුවිල උපරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.08.25 දින සිට), භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය

පත්කළ සාමාජික

14. පූජ්‍ය ආණමඩුවේ ධම්මදස්සි අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
15. මහාචාර්ය පූජ්‍ය කෝන්ගස්තැන්නේ ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.08.14 දින දක්වා)

    පූජ්‍ය අටමුනේ ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.08.15 දින සිට)
16. පූජ්‍ය පල්ලේගම හේමරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.11.17 දින දක්වා)

    පූජ්‍ය ඉහළහල්මිල්ලෑවේ රතනපාල ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2022.11.18 දින සිට)
17. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ
18. මහාචාර්ය පූජ්‍ය මැදගම්පිටියේ විපිතධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ
19. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත ගරුසිංහ මහතා

පුස්තකාලයාධිකාරී

20. වයි. කේ. තිස්ස බණ්ඩාර මහතා (වැඩ ආවරණ පුස්තකාලයාධිකාරී)

ලේඛකාධිකාරී - ලේකම්


21. යූ. ඩී. දොඩන්වල මහතා

1.4 රැස්වීම්

සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයීය බල මණ්ඩල හා අනිකුත් කමිටු පහත පරිදි රැස්වී ඇත.

	බල මණ්ඩල/ කමිටු	රැස්වීම් සංඛ්‍යාව
1	උත්තරීතර සභාව	02
2	පාලක සභාව	09
3	සනාතන සභාව	10
4	බෞද්ධ අධ්‍යයන පීඨ මණ්ඩලය	12
5	භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨ මණ්ඩලය	12
6	බෞද්ධ හා පාලි අධ්‍යයන අංශ රැස්වීම	12
7	ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශ රැස්වීම	11
8	භාෂා අධ්‍යයන අංශ රැස්වීම	12
9	සමාජියවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශ රැස්වීම	10
10	පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා කළමනාකරණ කමිටුව	02
11	උසස් උපාධි කමිටුව	04
12	පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා අධ්‍යයන මණ්ඩල	08
13	තත්ත්ව සහතිකකරණය සඳහා වූ සනාතන සභා ස්ථාවර කමිටුව	10
14	විදේශ සබඳතා ඒකකය	02
15	මුදල් කමිටුව	08
16	පුස්තකාල කමිටුව	06
17	නිවාඩු කමිටුව	08
18	විගණන කමිටුව	04
19	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව	14
20	සුළු ප්‍රසම්පාදන කමිටුව	10
21	ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුව	01

2. සංවිධාන ව්‍යුහය - ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය



3. ශිෂ්‍ය කටයුතු

3.1 ප්‍රථම උපාධි පාඨමාලා සඳහා නව ශිෂ්‍ය ඇතුළත්වීම් (දේශීය)

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2021/2022 ශිෂ්‍ය කණ්ඩායම සඳහා 2022 වසරේ දී ශිෂ්‍ය හිමිවරුන් 154 නමක් බඳවා ගන්නා ලදි. උන්වහන්සේලා තෝරා ගනු ලැබුවේ අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල හෝ ප්‍රාචීන මධ්‍යම විභාගයේ ප්‍රතිඵල මූලික සුදුසුකමක් වශයෙන් සලකා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය මගින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල පදනම් කර ගෙනය.

3.1.1 2022 වර්ෂයේ ශිෂ්‍ය බඳවා ගැනීම් : ශිෂ්‍ය කාණ්ඩය - 2021/2022


පීඨය	පාඨමාලාව	මාධ්‍ය	බඳවා ගැනීමට සැලසුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව
බෞද්ධ අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී	සිංහල/ ඉංග්‍රීසි	75	76
භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී, බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී	සිංහල/ ඉංග්‍රීසි	75	78
එකතුව			150	154*

3.1.2 පසුගිය වසර 05 තුළ ශිෂ්‍ය බඳවා ගැනීම්

වර්ෂය	බඳවා ගැනීමේ ශිෂ්‍ය කාණ්ඩය	බඳවා ගැනීමට සැලසුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාව	බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව	පාඨමාලාව අත්හැර ගිය ශිෂ්‍ය සංඛ්‍යාව
2018	2017/2018	150	148	03
2019	2018/2019	150	164*	02
2020	2019/2020	150	128	07
2021	2020/2021	150	153*	00
2022	2021/2022	150	154*	11

* මෙම ශිෂ්‍ය ප්‍රමාණය බඳවා ගැනීම සඳහා ශිෂ්‍ය ප්‍රවේශ කමිටුවේ නිර්දේශය මත පාලක සභාවේ අනුමැතිය ලැබී ඇත.

ප්‍රස්තාරය 1: පසුගිය වසර 05 තුළ බඳවා ගැනීමට සැලසුම් කළ හා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව



3.2 ප්‍රථම උපාධි පාඨමාලා සඳහා නව ශිෂ්‍ය ඇතුළත්වීම් (විදේශීය)

3.2.1 2022 වර්ෂයේ ශිෂ්‍ය බඳවා ගැනීම් : ශිෂ්‍ය කාණ්ඩය - 2020/2021

පීඨය	පාඨමාලාව	මාධ්‍ය	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව
බෞද්ධ අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී	ඉංග්‍රීසි	01

* පදනම් පාඨමාලාව හැදෑරීමෙන් පසු උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

3.3 උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය - 2022

පීඨය	උපාධි පාඨමාලාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව (2022.12.31 දිනට)					
		මාධ්‍ය	පළමු වසර ශිෂ්‍ය කාණ්ඩය 2020/2021	දෙවන වසර ශිෂ්‍ය කාණ්ඩය 2019/2020	තෙවන වසර ශිෂ්‍ය කාණ්ඩය 2018/2019	සිව්වන වසර ශිෂ්‍ය කාණ්ඩය 2017/2018	එකතුව
බෞද්ධ අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	සිංහල	70	38	46	-	154
		ඉංග්‍රීසි	06	01	02	-	09
	ශාස්ත්‍රවේදී (ගෞරව)	සිංහල	-	12	21	23	56
		ඉංග්‍රීසි	-	-	03	-	03
භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	සිංහල	64	29	38	-	131
		ඉංග්‍රීසි	05	01	-	-	06
	ශාස්ත්‍රවේදී (ගෞරව)	සිංහල	-	19	33	14	66
		ඉංග්‍රීසි	-	-	01	02	03
	බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)	සිංහල	-	11	09	15	35
		ඉංග්‍රීසි	-	-	-	-	-
එකතුව			**145**	**111**	**153**	**54**	**463**

3.4 අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා - 2022

පීඨය	උපාධි පාඨමාලාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	ස්ථිර ආචාර්යවරුන් සංඛ්‍යාව	ආචාර්ය: ශිෂ්‍ය අනුපාතය
බෞද්ධ අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/ගෞරව)	222	19	1:12
භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/ගෞරව) / බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)	241	25	1:10
එකතුව		**463**	**44**	**1:11**

3.5 ප්‍රථම උපාධි පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව - 2022

එක් එක් පීඨයේ ලියාපදිංචි ශිෂ්‍ය හිමිවරුන් අතුරින් උපාධි පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව

පීඨය	උපාධි පාඨමාලාව	සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව
බෞද්ධ අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	29
	ශාස්ත්‍රවේදී (ගෞරව)	16
	බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)	01
භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	30
	ශාස්ත්‍රවේදී (ගෞරව)	14
	බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)	11
එකතුව		**101**

3.5.1 පසුගිය වසර 05 තුළ ප්‍රථම උපාධි පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව

වර්ෂය	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	ශාස්ත්‍රවේදී (ගෞරව)	බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)	එකතුව
2018	63	14	7	**84**
2019	68	31	10	**109**
2020	11	-	-	**11** *
2021	57	29	10	**96**
2022	59	30	12	**101**
එකතුව	**258**	**104**	**39**	**401**

** කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම වසරේ සමාසික I පරීක්ෂණය පමණක් පැවැත්විය. එහිදී විභාගය සඳහා නැවත පෙනී සිටි (Repeat) ශිෂ්‍යයින් 11 දෙනෙකු පමණක් මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ඇත.*

3.6 පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා පිළිබඳ විස්තර

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය 2017 වර්ෂයේ දී පිහිටුවන ලදී. එමගින් දැනට පැවැති ශිෂ්‍යයන් සඳහා පමණක් පශ්චාත් උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබන අතර අනිකුත් බාහිර පාඨමාලා ගිහි පැවිදි දෙපාර්ශ්වයටම විවෘතය.

3.6.1 පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා

උපාධි පාඨමාලාව	**2021**	**2022**
දෙඅවුරුදු ශාස්ත්‍රපති (පර්යේෂණ) - MA	02	-
දර්ශනපති - MPhil	03	06
දර්ශන විශාරද - PhD	01	-
එකතුව	**06**	**06**

3.6.2 පශ්චාත් උපාධි සම්පූර්ණ කළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා

උපාධි පාඨමාලාව	2021	2022
දෙඅවුරුදු ශාස්ත්‍රපති (පර්යේෂණ) - MA	-	01
දර්ශනපති - MPhil	02	02
දර්ශන විශාරද - PhD	-	01
එකතුව	**02**	**04**

3.6.3 බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා සඳහා ලියාපදිංචි හා පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව

	පාඨමාලාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව		සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව	
		2021	2022	2021	2022
1	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව (බාහිර)	734	494	-	39
2	බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර)			40	42
3	ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර)		49	-	26
4	දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර)	57		-	21
5	ජ්‍යෝතිෂ්‍ය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)		34	15	-
6	ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)		34	-	08
7	දෙමළ භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)			08	-
8	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)			09	07
	එකතුව	**791**	**611**	**72**	**143**

3.7 ශිෂ්‍ය නේවාසිකාගාර පහසුකම්

2022 වර්ෂයේ දී නේවාසික පහසුකම් ඉල්ලුම් කළ සියලුම ශිෂ්‍ය භිමිවරුන්ට පහත දැක්වෙන නේවාසික පහසුකම් ලබා දී ඇත.

	නේවාසිකාගාරය	ධාරිතාව	ශිෂ්‍ය සංඛ්‍යාව
1	මානමුනාවත්ත ''ඉඳුරුවේ උත්තරානන්ද මහනාහිමි'' අනුස්මරණ දෙමහල් නේවාසිකාගාරය	75	56
2	මානමුනාවත්ත ''රද්දැල්ලේ පඤ්ඤාලෝක නාහිමි'' අනුස්මරණ සිව්මහල් නේවාසිකාගාරය	96	89
3	තිසාවැවවත්ත සිව් මහල් නේවාසිකාගාරය	200	318
	එකතුව	**371**	**463**

3.8 මහපොළ ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර - 2022

ශිෂ්‍ය කාණ්ඩය	ශිෂ්‍ය ප්‍රමාණය	ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව (2022.12.31 දිනට)		
		මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
පළමු වසර	145	-	143	143
දෙවන වසර	111	-	109	109
තෙවන වසර	153	31	113	144
සිව්වන වසර	54	15	38	53
එකතුව	**463**	**46**	**403**	***449**

** විභාග අක්‍රමිකතා සිදුකළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 05 නමකට සහ 2020/2021 අධ්‍යයන වර්ෂයේ පළමු සමාසිකාන්ත පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් නොලැබූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 08 නමකට මෙන්ම ස්ව කැමැත්තෙන් ශිෂ්‍යාධාර ලබාගැනීම ප්‍රතික්ෂේප කළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමකට ශිෂ්‍යාධාර ගෙවා නොමැත.*

3.9 වෙනත් ශිෂ්‍යත්ව / පාඨමාලා පිළිබඳ විස්තර - 2022

බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මෙම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා සඳහා පවත්වාගෙන යනු ලබන පාඨමාලා

	පාඨමාලාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව
1	ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	40
2	දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	40
3	ජපන් භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	40
4	චීන භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	25
5	තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	40

4. මානව සම්පත්

4.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය

4.1.1 අනුමත අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය (2022.12.31 දිනට)

සේවා කාණ්ඩය			වැටුප් කේතය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
තෘතීයික මට්ටම						
01	අධ්‍යයන සහායක - 2 කාණ්ඩය		U-AS 1	10	09	01
02	අධ්‍යයන සහායක - 1 කාණ්ඩය		U-AS 2	04	04	-
ජ්‍යෙෂ්ඨ මට්ටම						
03	I	කථිකාචාර්ය (ආධුනික)	U-AC 3 (IV)	50	10	04
	ii	කථිකාචාර්ය	U-AC 3 (III)		08	
	iii	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	U-AC 3 (II)		18	
	iv	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය	U-AC 3 (I)		06	
	v	සහාය මහාචාර්ය	U-AC 4		-	
	vi	මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය /ප්‍රමුඛ මහාචාර්ය	U-AC 5		03	
	vii	මහෝපාධ්‍යායය	U-AC 5		01	
04	පුස්තකාල කාර්ය මණ්ඩලය		U-AC 3	01	01	-
			U-AC 5	01	-	01
එකතුව				**66**	**60**	**06**

4.1.2 අභ්‍යන්තර ආචාර්යවරුන් අතුරින් දීමනාවක් ගෙවීමේ පදනමින් බඳවා ගැනීමට අනුමත තනතුරු (2022.12.31 දිනට)

තනතුර		අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
01	පීඨාධිපති	02	02	-
02	විනයාධිකාරි	01	01	-
03	අධ්‍යක්ෂ, පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය	01	01	-
04	අධ්‍යක්ෂ, අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය	01	01	-
05	අධ්‍යයනාංශ ප්‍රධාන	04	04	-
	එකතුව	**09**	**09**	**-**

4.1.3 පීඨ අනුව තථ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලය (2022.12.31 දිනට)

	තනතුර	බෞද්ධ අධ්‍යයන පීඨය	භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය	එකතුව
1	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	02	-	02
2	ප්‍රමුඛ මහාචාර්ය	-	01	01
3	මහාචාර්ය	-	-	-
4	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	09	15	24
5	කථිකාචාර්ය	07	01	08
6	ආධුනික කථිකාචාර්ය	01	09	10
7	තාවකාලික කථිකාචාර්ය	02	02	04
8	උපදේශක	03	06	09
	එකතුව	**24**	**34**	**58**

4.1.4 පීඨ අනුව බාහිර කථිකාචාර්යවරුන් (2022.12.31 දිනට)

	තනතුර	බෞද්ධ අධ්‍යයන පීඨය	භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය	එකතුව
1	බාහිර කථිකාචාර්ය	01	02	03

4.1.5. අධ්‍යයන හා/ හෝ වෙනත් නිවාඩු මත පශ්චාත් උපාධි හදාරනු ලබන කාර්ය මණ්ඩලය (2022.12.31 දිනට)

	කාර්ය මණ්ඩලය	දේශීය	විදේශීය	එකතුව
1	අධ්‍යයන	04	04	08
2	පරිපාලන	-	01	01

4.2 අනධ්‍යයන කාර්ය මණ්ඩලය

4.2.1 මාණ්ඩලික නිලධාරීන් (2022.12.31 දිනට)

සේවා කාණ්ඩය		වැටුප් කේතය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
තෘතීයික මට්ටම					
01	කනිෂ්ඨ විධායක	U-EX 1	07	06	01
ජ්‍යෙෂ්ඨ මට්ටම					
02	මධ්‍යම මට්ටමේ විධායක	U-EX 2	04	04	-
03	ජ්‍යෙෂ්ඨ විධායක	U-EX 3	02	02	-
	එකතුව		**13**	**12**	**01**

4.2.2 ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ කාර්ය මණ්ඩලය (2022.12.31 දිනට)

තනතුර		වැටුප් කේතය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
ප්‍රාථමික මට්ටම					
01	ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	U-PL 1	45	20	09
02	ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු	U-PL 2		03	
03	ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු	U-PL 3		13	
ද්විතීයික මට්ටම					
04	කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන	U-MN 1	49	34	03
05	සහකාර නිලධාරි - 1 බණ්ඩය	U-MN 2		03	
06	සහකාර නිලධාරි - 2 බණ්ඩය	U-MN 3		02	
07	මාණ්ඩලික සහකාර/විශේෂ ශ්‍රේණි/ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN 4		07	
08	කළමනාකරණ සහකාර - තාක්ෂණික	U-MT 1	02	02	
එකතුව			**96**	**84**	**12**


4.2.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලය අංශ අනුව බෙදී ගොස් ඇති ආකාරය (2022.12.31 දිනට)

	අංශ	මාණ්ඩලික නිලධාරීන්	කළමනාකරණ සහකාර හා සමාන්තර ශ්‍රේණි	කනිෂ්ඨ සේවක	එකතුව
01	මහෝපාධ්‍යායය කාර්යාලය	-	01	01	02
02	ලේඛකාධිකාරි කාර්යාලය	01	01	01	03
03	සාමාන්‍ය පාලන අංශය	01	09	12	22
04	ආයතන අංශය	01	03	01	05
05	අභ්‍යන්තර විගණන අංශය	01	02	01	04
06	අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශය	01	04	04	09
07	නඩත්තු අංශය	01	03	04	08
08	විභාග අංශය	01	03	01	05
09	මූලධන අංශය	01	01	01	03
10	මූල්‍ය පරිපාලන අංශය	02	07	02	11
11	සැපයුම් අංශය	01	01	-	02
12	පුස්තකාලය	-	04	02	06
13	බෞද්ධ අධ්‍යයන පීඨය	-	01	01	02
14	භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය	-	01	01	02
15	බෞද්ධ හා පාලි අධ්‍යයනාංශය	-	01	01	02
16	ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනාංශය	-	01	-	01
17	භාෂා අධ්‍යයනාංශය	-	01	01	02
18	සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය	-	01	01	02
19	පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය	01	03	01	05
20	ඉංග්‍රීසි භාෂා ඒකකය	-	-	-	-
	එකතුව	**12**	**48**	**36**	**96**

4.3 පසුගිය වසර 05 තුළ තථ්‍ය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය

වර්ෂය	අධ්‍යයන කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	එකතුව
2018	58	98	**156**
2019	55	98	**153**
2020	54	95	**149**
2021	58	99	**157**
2022	60	96	**156**

ප්‍රස්තාරය : තථ්‍ය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 2018 - 2022



5. පර්යේෂණ හා සංවර්ධනය

5.1. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන - 2022

2022 වර්ෂයේ දී මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලද ප්‍රකාශිත පර්යේෂණ කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

5.1.1 බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය.

<u>පර්යේෂණ පත්‍රිකා :-</u>

i. Wimalathissa Thero, Kirama, (2022) **'Outstanding Buddhist Culture between Sri Lanka and Vietnam in a Nutshell'** ISSN:0866-7314 p.40-49.

ii. ධම්මින්ද හිමි, ගාල්ලේ, (2022), **'සෙන් ඉගැන්වීමට බල පෑ ථෙරවාද ආභාසයඃ දාර්ශනික සහ සන්සන්දනාත්මක අධ්‍යයනයක්** (Theravāda Influence on Zen teaching: A Philosophical and Comparative Study), p.11.

iii. ධම්මින්ද හිමි, ගාල්ලේ, (2022), **'සතෝරි හෙවත් ආධ්‍යාත්මික විමුක්තිය පිළිබඳ සෙන් සහ මුල්-බුදුසමයාගත විවරණයක්'** (*Satori* or Spiritual Liberation: A Study based on Zen and Early Buddhist Notion), p.11.

iv. Mahinda Thero, Ehelepola, (2022) **'A Brief Meaningful Account on Meditation'** THE 8TH PROJECT SEMINAR OF BUDDHIST DELEGATES FOR THE DEVELOPMENT AND PROPAGATION OF BUDDHISM IN THE MEKONG AND ASIA REGION (DPBMA), Thailand. p.64-84.

<u>ශාස්ත්‍රීය ලිපි</u>

v. මහින්ද හිමි, ඇහැලේපොල, (2022). **'දඹදෙණි යුගයේ දළදා සංස්කෘතිය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක්'** පූජනීය දළඳා සංස්කෘතිය, 17 වෙළුම, (සංස්.), එච්.එම්. ඩී. ආර්. හේරත්, මහනුවරඃ මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්ත්තමේන්තුව. p.37-52.

<u>සංස්කරණ :-</u>

vi. මහින්ද හිමි, ඇහැලේපොල, (2022), **'ධම්මානන්ධාභිනන්දනඃ බෞද්ධ තර්කය හා න්‍යාය අධ්‍යනය'**, මහනුවරඃ ප්‍රකාඃ- අස්ගිරි මහාවිහාරයීය යටවත්ත පන්සල

vii මහින්ද හිමි, ඇහැලේපොල, (2022), **'ඓතිහාසික සුදුහුම්පොළ රජමහා විහාරය'**, මහනුවරඃ ප්‍රකාඃ- අස්ගිරි මහාවිහාරයීය යටවත්ත පන්සල

5.1.2 ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය

<u>ශාස්ත්‍රීය ලිපිඃ-</u>

i ධම්මරතන හිමි, කහටගස්දිගිලියේ, (2022), **''විභංග අට්ඨකථාවේ මිනිස් ශරීර අස්ථි කොටස් වර්ගීකරණය හා උපමා භාවිතය''** ආයුර්වේද අධ්‍යයන සඟරාව, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පිටු 60-74.

ii ගුණාලංකාර හිමි, ගොමිල, (2022), **"ආයුර්වේද විචරිත උන්මාද රෝග සහ මනෝචිකිත්සක ක්‍රම පිළිබඳ විග්‍රහයක්"**, ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන සඟරාව, ආයුර්වේද අධ්‍යයනය. 3 වන වෙළුම, පළමුවන කලාපය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පිටු 36-59.

iii ආනන්ද චන්ද්‍රකීර්ති හිමි, බළන්ගොඩ, (2022), **''බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක හිමියන්ගේ ශික්ෂාකාමී දිවිපැවැත්ම, සංක්ෂිප්ත විමර්ශනයක්''** ධම්මගතාසති ශාස්ත්‍රීය සංග්‍රහය, ප්‍රකාඃ- මහාවිහාරවංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහනිකායේ ප්‍රකාශනයක්, පිටු 688-693.

iv ධම්මික හිමි, පහලගම, (2022), **''අනුමානය පිළිබඳ න්‍යාය බිංදුවේ ඉගැන්වීම''** ධම්මාභිනන්දන බෞද්ධ තර්කය හා න්‍යාය අධ්‍යයනය ශාස්ත්‍රීය සංග්‍රහය, ප්‍රකාඃ- උඩගම පන්සල, පිටු 169-179.

v ධම්මික හිමි, පහලගම, (2022), **''ථේරවාදයෙහි චීවරකරණය හා භාවිතය පිළිබඳ විමසුමක්''** ධම්මගතාසති ශාස්ත්‍රීය සංග්‍රහය, ප්‍රකාඃ-මහාවිහාරවංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහනිකාය, පිටු 338-350.

<u>ග්‍රන්ථ ඃ-</u>

In refereed non-indexed Journals (local)

vi ගුණාලංකාර හිමි, ගොමිල, (2022), **"ඉගෙනුම් දුබලතාවන්හි ලක්ෂණ සහ ප්‍රතිකාර ප්‍රවේශ පිළිබඳ විමසුමක්",** අධ්‍යාපන විද්‍යා අධ්‍යයන (විමර්ශිත ග්‍රන්ථය), සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

In non-refereed non-indexed Journals (local)

vii **''උපෝසථයෙහි සාසනික වැදගත්කම''** ධම්මප්පභා ශාස්ත්‍රීය සංග්‍රහය, 2022, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, පිටු. 204-216.

<u>සංස්කරණ</u>

viii **ප්‍රවචන විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය**, Volume 13 - No 1. - 2022-1. අනුරාධපුර, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

ix Editorial Board of the Proceedings book, 7th International Buddhist Conference on Buddhist Education, on 16th November 2022.

x ධම්මික හිමි, පහලගම, (සංස්) (2022), **''විමලප්‍රභා''** කහතුඩුව, ප්‍රකාඃ- සවිඳු, ISBN 978-955-3797-05-6.

xi ධම්මික හිමි, පහලගම, (සංස්) (2022), **''පටිපදා''** කොළඹ, ප්‍රකාඃ- ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකාය, ISBN 978-955-7524-009.

xii ධම්මික හිමි, පහලගම, (සංස්) (2022), **"ආයුර්වේද අධ්‍යයන සඟරාව - වෙළුම 1",** ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ISSN 2719-2504.

xiii Dhammika Thero, Phalagama, (2022), **''PROCEEDINGS''** 7 th International Buddhist Conference - IBC 2022" , Bhikshu University of Sri Lanka, 256 Page.

Secretary

xiv Joint Secretary of the 7th International Buddhist Conference on Buddhist Education, on 16th November 2022.

5.1.3 භාෂා අධ්‍යයන අංශය

ශාස්ත්‍රීය ලිපි

i. රාහුල හිමි, කනංගමුවේ සහ සිරිසුමන හිමි, තිඹිරිවැව, (2022) *'සිදත් සඟරාවේ අක්ෂර මාලාව'* ''ප්‍රභාෂා'' ශාස්ත්‍රීය සංග්‍රහය, 2022 - දෙවන වෙළුම - I කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පිටු 75-82.

ii. රාහුල හිමි, කනංගමුවේ සහ සිරිසුමන හිමි, තිඹිරිවැව, (2022) *'කෝට්ටේ යුගයේ විරචිත සන්දේශ කාව්‍යවලින් හෙළිවන තත්කාලීන දේවවිශ්වාස පද්ධතිය:* ''ප්‍රභාෂා'' ශාස්ත්‍රීය සංග්‍රහය, 2022 - දෙවන වෙළුම - II කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පිටු 87-103.

iii. සෝභිත හිමි, කරඳගොල්ලේ, (2022) ***'ගැටුම් හා අර්බුද ඇතිවීම සඳහා දැඩි තෘෂ්ණාව බලපාන ආකාරය පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය ඇසුරෙන් කෙරෙන විමසුමක්', ''ප්‍රභාෂා'' ශාස්ත්‍රීය සංග්‍රහය***, දෙවන වෙළුම - I කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පිටු 70-87.

iv කුමාරකස්සප හිමි, කළුවානේ, (2022), *'වේද කාලීන සමාජය පිළිබඳ තොරතුරු ලබා ගැනීමේදී ඍග්වේදය කෙතරම් දුරට ප්‍රමාණික මූලාශ්‍රයක් ද?'* ''ප්‍රභාෂා'' ශාස්ත්‍රීය සංග්‍රහය, 2022 - දෙවන වෙළුම - II කලාපය', භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. (මුද්‍රිත වීමට නියමිත), පිටු 55-61.

v කුමාරකස්සප හිමි, කළුවානේ, (2022), ***'Significance of the first chapter of the Lankavathara Suthra'*** 'ප්‍රවචන' විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය, 2022 - 13 කලාපය - පළමු අංකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. (මුද්‍රිත වීමට නියමිත), පිටු 100-112.

vi කෝලිත හිමි, පහළ ඇරැවුල, (2022), ***'A Comparative Study on the use of Metaphors of Nature with reference to selected Buddhist Verses and Shakespearean Sonnets,*** ''ප්‍රභාෂා'' ශාස්ත්‍රීය සංග්‍රහය, 2022 - දෙවන වෙළුම - I කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පිටු 38-54

vii කෝලිත හිමි, පහළ ඇරැවුල, (2022), ***'A Critical Study through the Buddhist Perspective on "The Rime of the Ancient Mariner",*** ''ප්‍රභාෂා'' ශාස්ත්‍රීය සංග්‍රහය, 2022 - දෙවන වෙළුම - II කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පිටු 45 - 52 .

viii කෝලිත හිමි, පහළ ඇරැඹුල, (2022), ***'A Critical study of Comparison of Similes and Metaphors on nature in the Selected Shakespearean Sonnets and the Verses in the Dhammapa'*** 'ප්‍රවචන' විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය, 2022 - 13 කලාපය - පළමු අංකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. (මුද්‍රිත වීමට නියමිත), පිටු 84-96.

<u>සංස්කරණ</u>

ix ඉන්දජෝති හිමි, බලදොර, (සංස්.) (2022), ''ප්‍රවචන'' ශාස්ත්‍රීය සංග්‍රහය, 2020 - **II** වන අංකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

x ඉන්දජෝති හිමි, බලදොර, (සංස්.) (2022), ''ප්‍රවචන'' ශාස්ත්‍රීය සංග්‍රහය, 2021 - **II** වන අංකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

xi සෝභිත හිමි, කරඳගොල්ලේ, (ප්‍රධාන සංස්.) (2022), ''ප්‍රභාෂා'' ශාස්ත්‍රීය සංග්‍රහය, 2022 - දෙවන වෙළුම - II කලාපය', භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

xii Sobhitha, Ven. Karandagolle, (Co-Eds), Proceeding, 7th International Conference (Online) Bhiksu University of Sri Lanka, Anuradhapura, 23rd December 2022.

xiii කුමාරකස්සප හිමි, කළුවානේ, (ප්‍රධාන සංස්.) (2022), **''ප්‍රභාෂා'' ශාස්ත්‍රීය සංග්‍රහය**, 2022 - දෙවන වෙළුම - **I** කලාපය', භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

xiv උපනන්ද හිමි, තෙරිපැහැ, (සංස්.) (2022), **''ප්‍රභාෂා''** ශාස්ත්‍රීය සංග්‍රහය, (2022) - දෙවන වෙළුම - **II** කලාපය', භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

xv පුෂ්පකුමාර, සනත්, (සංස්.) (2022), **''ප්‍රභාෂා''** ශාස්ත්‍රීය සංග්‍රහය, දෙවන වෙළුම - **I** කලාපය', භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

xvi **Implementation of E-learning platforms to learn English among ... ESL Learners with COVID -19 outbreak**: Benefits and Issues, 2022.

<u>ග්‍රන්ථ :-</u>

xvii Kumarakassapa, Ven. Kaluwane, (2022), **Teaching fortpolio**, submitted to the Staff Development Center of The Rajarata University, 23rd Cycle, 2022.

xviii උපනන්ද හිමි, තෙරිපැහැ, "**චීන භාෂාධ්‍යයන**", (2022), ගොඩගේ පොත් ප්‍රකාශකයෝ, මරදාන

<u>Articles</u>

xix උපනන්ද හිමි, තෙරිපැහැ, (2022), **"ආගමික ප්‍රාස්තාව හා සමාජ වාග්විද්‍යාව"**, ධර්මප්පභා අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී සමුද්‍රාරාමය, වාද්දුව, කළුතර, පිටු 345-368.

xx උපනන්ද හිමි, තෙරිපැහැ, (2022), ''**ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගමික ප්‍රාස්තාවික භාෂාවෙහි අභ්‍යන්තරික වාග්විද්‍යානුකූල ස්වරූපය"**, විමලප්‍රභා අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී සුමනාරාමය, බටකැත්තර, අනුරාධපුරය, පිටු 69-78.

Reviewed Articles

xxi උපනන්ද හිමි, තෙරිපැහැ, (2022), **"වාගාලාප අර්ථගැන්වීමෙහිලා චීන භාෂාවෙහි සංඥානික සත්වවාචී සර්වනාමපදවල ප්‍රකරණබද්ධ භාවිතය"** සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය - 13 කලාපය. පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ ඒකකය, සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය. (මුද්‍රිත වීමට නියමිත), පිටු 67-76.

xxii උපනන්ද හිමි, තෙරිපැහැ, (2022), **"වාගාලාප අර්ථගැන්වීමෙහිලා චීන භාෂාවෙහි ස්ථානවාචී සර්වනාමපදවල ප්‍රකරණබද්ධ භාවිතය" ''ප්‍රවචන''** විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය, පළමු කලාපය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. (මුද්‍රිත වීමට නියමිත), පිටු 84-92.

Peer Reviewed Articles

xxiii උපනන්ද හිමි, තෙරිපැහැ, (2022), **"චීන භාෂාව, වාග්විද්‍යාව සහ පර්යේෂණ ප්‍රවේශ**", ''ප්‍රභාෂා'' විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය, දෙවන වෙළුම - I කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. (මුද්‍රිත වීමට නියමිත), පිටු 55-69.

xxiv උපනන්ද හිමි, තෙරිපැහැ, (2022), **"චීන බෞද්ධ ආගමික ප්‍රාස්තාවික භාෂාවෙහි අභ්‍යන්තරික වාග්විද්‍යානුකූල ස්වරූපය"**, ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. (මුද්‍රිත වීමට නියමිත), පිටු 45-53.

xxv උපනන්ද හිමි, තෙරිපැහැ, (2022), **"චීන භාෂාවේ සරල වාක්‍යයක සංස්ථිතිය"**, සමෝධාන සමාජීය හා මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. (මුද්‍රිත වීමට නියමිත), පිටු 96-103.

5.1.4 සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය

පර්යේෂණ පත්‍රිකා ඃ-

i නන්ද හිමි, ගෝනලගොඩ සහ කලුබෝවිටියන සෝරත හිමි (2022) **'පිරිවෙන් ආයතනවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී කරගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනයක්'** BUSL-IOC 2022, Bhiksu University of Sri Lanka – Anuradhapura.

ii ''පිරිවෙන් අධ්‍යාපන ආයතනවල කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්'', 7th International Buddhist conference 2022, Bhiksu University of Sri Lanka.

iii ''පිරිවෙන් ආයතනවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කරගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගත හැකි ආකාරය විමර්ශනාත්මක අධ්‍යයනයක්," **ජාත්‍යන්තර සම්මන්ත්‍රණය**, (2022), ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

iv "ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ අධ්‍යාපන රටාව සහ වර්තමාන බටහිර අධ්‍යාපන රටාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්" **ජාත්‍යන්තර සම්මන්ත්‍රණය**, (2022), ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

v "ගුරුවරයාගේ ස්වභාවය ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය කෙරෙහි බලාපාන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ත්‍රිපිටකාගත සූත්‍රානුසාරයෙන්)" **ජාත්‍යන්තර සම්මන්ත්‍රණය**, (2022), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල.

vi "ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීම පිළිබඳ අධ්‍යයනයක්" **ජාත්‍යන්තර සම්මන්ත්‍රණය**, (2022), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල.

<u>ශාස්ත්‍රීය ලිපි ඃ-</u>

vii විමලබන්ති හිමි, ගල්වැවේ. (2022), ''**මූල බ්‍රාහ්මීය අභිලේඛනවලින් හෙළිවන දේශපාලන හා පරිපාලන ව්‍යුහය''** මහාචාර්ය ටී. ජී. කුලතුංග අභිස්තව සංග්‍රහය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ 07, පි.221 - 249.

viii Hemaloka, Muwapetigewala (2022). '**Impact of Self-esteem on Drug Addiction among Adults in Sri Lanka'**, Annual Research Congress-2022, Postgraduate Institute of Humanities and Social Sciences, University of Peradeniya, p.59.

ix **'ගෝලීය පාරිසරික අර්බුද අවම කිරීම සඳහා බෞද්ධ පාරිසරික ආචාරධර්මයන්හි උපයෝගීතාවඃ මුල් බුදුසමය ඇසුරෙන් කෙරෙන දාර්ශනික අධ්‍යයනයක්', (2022),** (දර්ශනපති උපාධිය සඳහා සිදුකළ පර්යේෂණය) මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

x නන්ද හිමි, ගෝනලගොඩ, (2022), **' නූතන පාරිසරික අර්බුද විසඳීමෙහිලා බෞද්ධ ආචාර ධර්මයන්හි උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්'** *පටිපදා,* (සංස්ඃ-) අක්මීමන ධම්මපාල හිමි සහ තවත් අය, ශ්‍රී ලංකා රාමාඤ්ඤ මහානිකාය. පි. 41-48.

xi සුදත්ත හිමි, මඩුගල්ලේ. (2022). **''ජින් පියාජේට අනුව ප්‍රජානන සංවර්ධන ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්''** සිත් සියපත් ශාස්ත්‍රීය සංග්‍රහය, - 2022, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. පිටු අංක 17-34.

xii සුදත්ත හිමි, මඩුගල්ලේ. (2022). **''සමාජානුයෝජනය හා ගුරු භූමිකාව'** අධ්‍යාපන විද්‍යා අධ්‍යයන විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය 2021 - කලාපය 1, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. පිටු අංක 22-44.

xiii සුදත්ත හිමි, මඩුගල්ලේ. (2022). **''අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති සම්බන්ධය පිළිබඳ විමසීමක්''.** සමාජීයවිද්‍යා අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය - 2021, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. පිටු අංක 22-44.

xiv සෝරත හිමි, කළුබෝවිටියන, (2022) **"නව යොවුන්වියේ සමාජානුයෝජනය**" අධ්‍යාපන සමාජ විද්‍යාව, අධ්‍යාපනවිද්‍යා අධ්‍යයන විමර්ශිත ග්‍රන්ථය, (සංස්ඃ-) හඳගිරියේ සිරිසුමන හිමි සහ මඩුගල්ලේ සුදත්ත හිමි, පළමු වෙළුම -I, කලාපය - I, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.75-107.

xv සෝරත හිමි, කළුබෝවිටියන, (2022) **"ශ්‍රී ලංකාවේ පැරණි දේශීය බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ විමසුමක්**" *විමලප්‍රභා, පූජ්‍ය පොල්හේනේ විමල නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්ඃ-) පනාමුරේ චන්දිම හිමි, සවිදු ප්‍රකාශන, කහතුඩුවව, පි.82-98.

<u>විමර්ශිත ශාස්ත්‍රය සඟරා</u>

xvi සෝමානන්ද හිමි, කුඩාවැවේ, (2022), ''**බුද්ධෝත්පත්ති දේශය පිළිබඳ නූතන ශ්‍රී ලාංකේය මතවාද හා ගැටලු**'' සංගායනා (කාලීන ශාසනික අභියෝග පිළිබඳ විමර්ශනාත්මක ලිපි එකතුවකි) ශාස්ත්‍රීය පර්යේෂණ ලේඛන සංග්‍රහය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පිටු. 305-327.

<u>ආරාධිත දේශන</u>

xvii සෝමානන්ද හිමි, කුඩාවැවේ, **''ශ්‍රී ලාංකේය සමාජ, සංස්කෘතිය කෙරෙහි බලපෑම් කළ බ්‍රාහ්මණයෝ, සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරෙන් විමර්ශනයක්''** අධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධන වැඩමුළුව, 28.06.2022, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

xviii බෞද්ධ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, (2022) පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

xix **'බුදුදහම සහ සොල්දාදුවා'** ,2022-05-17. පාබල සේනාංක මූලස්ථානය, 62 සේනාංකය, යුධ හමුදා කඳවුර ගල්කුලම පදවි-ශ්‍රීපුර

xx **'බුදුදහම සහ සොල්දාදුවා'**,2022-05-17. 56 සේනාංකය, යුධ හමුදා කඳවුර කොක්ඵළිය - වව්නියාව

<u>සංස්කරණ</u>

xxi සිරිසුමන හිමි, හඳගිරියේ සහ සුදත්ත හිමි, මඩුගල්ලේ (2021)*. ***අධ්‍යාපන සමාජවිද්‍යාව, අධ්‍යාපනවිද්‍යා අධ්‍යයන විමර්ශිත ග්‍රන්ථය,*** තෙවන වෙළුම -II කලාපය I හා II, අනුරාධපුර : සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය ප්‍රකාශන.

xxii සිරිසුමන හිමි, හඳගිරියේ සහ සුදත්ත හිමි, මඩුගල්ලේ සහ කළුබෝවිටියන සෝරත හිමි, (2022). ***අධ්‍යාපන මනෝවිද්‍යාව, අධ්‍යාපනවිද්‍යා අධ්‍යයන විමර්ශිත ග්‍රන්ථය,*** පළමු වෙළුම -II කලාපය I හා II, අනුරාධපුර: සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය ප්‍රකාශන.

<u>සඟරා සංස්කාරක ඃ-</u>

xxiii Academic journal of Archeology, Department of Social Sciences and Comparative Studies, Bhiksu University of Sri Lanka, 2022.

<u>ක්ෂේත්‍ර පර්යේෂණ ඃ-</u>

xxiv Uparathana Thero, Uduwila, Conducted a **"Prehistoric Excavation of Kebelle lena in Rasigala",** Agalawattha." 2022.

5.2 අධ්‍යයන පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු.

2022 වර්ෂයේ දී මෙම විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර පහත දැක්වේ.

	අධ්‍යයන පාඨමාලා / සම්මන්ත්‍රණ/ වැඩමුළුව	සංඛ්‍යාව
1	උපාධි පාඨමාලා	09
2	පශ්චාත් උපාධි පාඨමාලා	03
3	සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලා	12
4	වැඩමුළු	09

5.2.1 උපාධි පාඨමාලා

i. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)
ii. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) (බාහිර උපාධි පාඨමාලාව)
iii. ශාස්ත්‍රවේදී (ගෞරව) - බෞද්ධ දර්ශනය
iv. ශාස්ත්‍රවේදී (ගෞරව) - බෞද්ධ ශිෂ්ටාචාරය
v. ශාස්ත්‍රවේදී (ගෞරව) - පාලි
vi. ශාස්ත්‍රවේදී (ගෞරව) - පුරාවිද්‍යාව
vii. ශාස්ත්‍රවේදී (ගෞරව) - සංස්කෘත
viii. ශාස්ත්‍රවේදී (ගෞරව) - බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය
ix. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)

5.2.2 පශ්චාත් උපාධි පාඨමාලා

i. දෙඅවුරුදු ශාස්ත්‍රපති (පර්යේෂණ) - MA
ii. දර්ශනපති - MPhil
iii. දර්ශන විශාරද - PhD

5.2.3 සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලා

i. ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
ii. දෙමළ භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
iii. ජපන් භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
iv. චීන භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
v. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව
vi. බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව
vii. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව
viii. දෙමළ ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව
ix. ජ්‍යොතිෂ්‍ය උසස් සහතික පත්‍ර (බාහිර) පාඨමාලාව
x. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර (බාහිර) පාඨමාලාව
xi. දෙමළ සහතික පත්‍ර (බාහිර) පාඨමාලාව
xii. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහතික පත්‍ර (බාහිර) පාඨමාලාව

6. පුස්තකාලයීය කාර්ය සාධනය

6.1 පුස්තකාලය සතු ග්‍රන්ථ සංචිතය (2022.12.31 දිනට)

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සතු ග්‍රන්ථ සංඛ්‍යාව 64,259 ක් වේ. ඒවා පාඨකයින්ගේ පරිහරණයට පහසුවන සේ පහත සඳහන් පරිදි වර්ගීකරණය කර ඇත.

<u>පුස්තකාලයීය ග්‍රන්ථ වර්ගීකරණය</u> - ඩිවි දශම වර්ගීකරණය 21 (Dewey Decimal Classification - 21)

000 - සාමාන්‍ය කෘති	- General Works
100 - දර්ශනය සහ මනෝවිද්‍යාව	- Philosophy & Psychology
200 - ආගම	- Religion
300 - සමාජ ශාස්ත්‍ර	- Social Sciences
400 - භාෂාව	- Language
500 - ස්වභාව විද්‍යා සහ ගණිතය	- Science
600 - තාක්ෂණ විද්‍යා (ව්‍යවහාර විද්‍යා)	- Technology
700 - කලා හා ලලිත කලා	- Arts & Recreation
800 - සාහිත්‍යය	- Literature
900 - භූගෝල විද්‍යාව සහ ඉතිහාසය	- History & Geography

6.2 විඥාපන සම්පත් අත්පත් කර ගැනීම - 2022

	වර්ගය	ප්‍රමාණය	වටිනාකම (රු.)
1	මිලදී ගත් ග්‍රන්ථ ප්‍රමාණය	786	327,296.50
2	පරිත්‍යාග ලත් ග්‍රන්ථ	292	558,530.48
3	විශේෂ පරිත්‍යාග	965	
4	පරිත්‍යාග - පුස්තිකා	01	50.00
	එකතුව	**2044**	**885,876.98**

❖ **ග්‍රන්ථ සංරක්ෂණය සඳහා සිදුකරන ලද පොත් බැඳීම්** - 72

6.3 පුස්තකාල සාමාජිකත්වය - 2022

කාණ්ඩය	ලියාපදිංචිකළ සාමාජිකයින් සංඛ්‍යාව	සමස්ත සාමාජික සංඛ්‍යාව
අභ්‍යන්තර ශිෂ්‍ය හිමිවරුන්	161	417
අධ්‍යයන කාර්ය මණ්ඩලය	01	57
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	00	100
බාහිර පාඨමාලා සාමාජිකයින්	02	80
එකතුව	**164**	**654**

6.4 පාඨකයින් සඳහා පුස්තකාලයෙන් නිකුත් කරන ලද පොත් සංඛ්‍යාව

	2021 වර්ෂය	2022 වර්ෂය
නිකුත් කළ පොත් ප්‍රමාණය	1,509	11,890

7. මූල්‍ය කාර්ය සාධනය

7.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

රුපියල්

	විෂය	2021	2022
1	පුද්ගල පඩිනඩි	283,124,729	308,082,621
2	දේශීය/විදේශීය ගමන් වියදම්	2,863,864	4,212,103
3	සැපයුම්	5,416,267	11,468,452
4	නඩත්තු	4,518,857	9,275,533
5	ගිවිසුම්ගත සේවා	35,658,851	42,134,579
6	වෙනත්	15,808,942	27,835,863
	එකතුව	**347,391,510**	**403,009,151**

7.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

රුපියල්

	විෂය	2021	2022
1	ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම	7,505,858	7,819,392
2	යන්ත්‍ර මිලදී ගැනීම්	602,239	
3	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	107,923,811	11,500,958
4	වෙනත් (ගොඩනැගිලි සහ පුනරුත්ථාපන)	3,758,368	1,552,058
5	පොත් මිලදී ගැනීම	35,415	432,390
6	ඉඩම් හා ඉඩම් සංවර්ධන	9,778,668	-
7	හැකියා වර්ධනය	305,534	80,000
8	පර්යේෂණ වැඩමුළු වියදම්	2,090,107	1,725,202
	එකතුව	**132,000,000**	**23,110,000**

7.3 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	අරමුදල් සම්පාදන ආයතනය	මුළු පිරිවැය ඇස්තමේන්තුව
1	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නව පරිශ්‍රයක පිහිටුවීමේ ව්‍යාපෘති අදියර I	ශ්‍රී ලංකා රජය	1,300
2	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නව පරිශ්‍රයක පිහිටුවීමේ ව්‍යාපෘති අදියර II	ශ්‍රී ලංකා රජය	900
	එකතුව		2,200

7.4 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	මුළු පිරිවැය ඇස්තමේන්තුව	2021 වියදම	2022 වියදම	2022.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය ٪
	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ව්‍යාපෘති අදියර I හා II	2,200	99.86	11.5	2072.47	89.55%

7.5 යටිතල පහසුකම් පිළිබඳ විස්තර

7.5.1 යටිතල පහසුකම් පිළිබඳ විස්තර - මූලධන ව්‍යාපෘති

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	වැඩ අවසන් කිරීමේ දිනය	මුළු පිරිවැය ඇස්තමේන්තුව	2022 වියදම	2022.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය ٪
1	විදේශීය ශිෂ්‍ය නේවාසිකාගාරය (කාමර 25)	2020.01.13	104	0.523	81.366	100%
2	මහෝපාධ්‍යායය නිලනිවාසය, පීඨාධිපති නේවාසිකාගාරය, අංශාධිපති නේවාසිකාගාරය, පරිපාලන නිලධාරි නේවාසිකාගාරය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය නේවාසිකාගාරය	2021.03.08	255	1.179	176.823	100%
3	බහුකාර්ය ගොඩනැගිල්ල	2023.09.11 (දීර්ඝ කළ)	486	0.697	178.053	37.28%
4	භාෂා හා සංස්කෘතික පීඨය ඉදිකිරීම	2014.02.15 (දීර්ඝ කළ)	383	0.353	254.592	100%
5	බෞද්ධ අධ්‍යයන පීඨය ඉදිකිරීම	2013.05.15 (දීර්ඝ කළ)	268	0.511	196.397	100%
6	නේවාසික ඉදිකිරීම (අදියර) සහ උපශාලාධිපති නිල නිවස ඉදිකිරීම	2013.05.15 (දීර්ඝ කළ)	118	3.605	68.618	100%
	එකතුව		1614	6.868	955.849	

7.5.2 යටිතල පහසුකම් පිළිබඳ විස්තර - පුනරුත්ථාපන ව්‍යාපෘති

	විෂය	2021 වියදම (රු)	2022 වියදම (රු)
1	පුනරුත්ථාපන ව්‍යාපෘති	28,416,731	1,323,066
2	උපදේශන සේවා ගාස්තු	-	-
3	රැඳවුම් මුදල් නිදහස් කිරීම	117,759	489,288
4	තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා ගෙවීම	49,000	-

7.6 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

රුපියල්

	විෂය	2021		2022		
		ලැබීම්	වියදම	ලැබීම්	වියදම	ඉතිරිය/ අතිරික්තය
1	ව්‍යාපෘති නොවන පුනරුත්ථාපන	341,400,000	347,391,510	395,200,000	403,009,151	(7,809,151)
2	ව්‍යාපෘති නොවන මූලධන	6,154,000	6,154,009	11,609,042	11,609,042	-
3	ව්‍යාපෘති - දේශීය අරමුදල්	125,846,000	125,846,000	11,500,958	11,500,958	-

7.7 මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2022

රුපියල්

	විෂය	2021	2022
1	ඒක ශිෂ්‍ය පිරිවැය - පුනරාවර්තන වියදම අනුව	750,306	870,430
2	ඒක ශිෂ්‍ය පිරිවැය - මූලධන වියදම අනුව	285,097	49,914
	එකතුව	**1,035,403**	**920,344**

8.1 තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව.

පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම බෞද්ධ දර්ශනයේ මූලික පරමාර්ථයකි. ඒ අනුව මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරමාර්ථය බෞද්ධ දර්ශනය හා ඒ හා ආනුෂංගික ක්‍රියාකාරකම් සමග සෘජුවම බැඳී ඇති බැවින් විශ්වවිද්‍යාලය මගින් සිදුකරනු ලබන සෑම ක්‍රියාකාරකමක් ම පරිසරය ආරක්ෂා කරමින් තිරසර සංවර්ධනයක් කරා ගමන් කිරීමට පහසුවන සේ සකස් කර ඇත.

තිරසර සංවර්ධනය මත පදනම්ව විශ්වවිද්‍යාලය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

1. 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද සූර්ය බල විදුලි පද්ධතිය (100KW) හා සූර්ය බල වීදී පහන් කණු පද්ධතිය (පහන් 70ක් සහිත) මගින් මේ වන විට විශ්වවිද්‍යාලයේ මාසික විදුලි අවශ්‍යතාවයෙන් 30% ආසන්න ප්‍රතිශතයක් සපුරා ගනු ලැබේ. ලැබෙන ප්‍රසම්පාදන ප්‍රතිපාදන මත මෙය ඉදිරියේ දී 100% දක්වා වැඩිකර ගැනීමට අපේක්ෂා කෙරේ.

2. විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සහභාගීත්වයෙන් ප්‍රදේශයේ පාරිසරික සාධකයන්ට ඔරොත්තු දෙන ඖෂධ වර්ග, පළතුරු හා වෙනත් දුර්ලභ ශාඛ රෝපණය කොට පවත්වාගෙන යාමේ ව්‍යාපෘතියක් වාර්ෂිකව සිදුකරමින් පවති.

3. විශ්වවිද්‍යාලය විසින් දෛනිකව බැහැරකරනු ලබන දිරාපත්වන කසළ භාවිතයෙන් කාබනික පොහොර (කොම්පෝස්ට්) නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

4. පරිසර හානිය වලක්වා ගැනීම පිණිස විශ්වවිද්‍යාලයෙන් වාර්ෂිකව ඉවත්කරනු ලබන පුවත්පත්, සඟරා, ලිපිද්‍රව්‍ය ආදිය ප්‍රතිචක්‍රීයකරණය සඳහා යොමු කෙරේ.

5. විශ්වවිද්‍යාලයේ මානමුනාවත්ත පරිශ්‍රයේ හා තිසාවැවවත්ත පරිශ්‍රයේ මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධති දෙකක් සවිකර එමගින් පිටවන ජලය විශ්වවිද්‍යාලයේ පරිසර සංවර්ධනය සඳහා යොදනු ලැබේ.

6. විශ්වවිද්‍යාලය මගින් වාර්ෂිකව බැහැර කරනු ලබන අබලි භාණ්ඩ රජයේ වෙනත් ආයතනවල නැවත ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කරනු ලැබේ.

7. විශ්වවිද්‍යාලය සතු සම්පත් උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි නිසි ක්‍රමවේද සකස් කරමින් පවතී. ඒ යටතේ දැනටමත් විශ්වවිද්‍යාලය තුළ හරිත සංකල්පය ක්‍රියාත්මක කෙරේ.

8. කඩදාසි භාවිතය අවම කිරීම සඳහා මෙම විශ්වවිද්‍යාලය මගින් අන්තර්ජාල සන්නිවේදන ක්‍රම වැඩි වශයෙන් භාවිත කරනු ලැබේ.



2022 විගණකාධිපති වාර්තාව හා පිළිතුරු

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

අනුරාධපුර

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NCCG/AN/D/BUSL/22/AQ/03

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 26 දින

මහෝපාධ්‍යයන් වහන්සේ,

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,

අනුරාධපුර.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 46 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් හි ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.35,695,254 ක් වූ වත්කම් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ රු.23,110,000ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 117(ඇ) ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් දේපළ පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනම අයිතමයක් ලෙස පෙන්නුම් කළ යුතු වුවද පිරිවැය රු.495,140 ක් වූ පරිගණක මෘදුකාංග වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍යප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන හික්ෂු විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන

පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණන්යේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනම කොටසෙහි විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති (අ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරනු ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලයට සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2012 අංක 15 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනත 11 ඡේදය (ආ)(XV)	අදාල සංශෝධන පනත අනුව පරිවාස කාලය අවසානයේ නිලධාරීන් ස්ථීර කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය යුතු වුවද ඊට

	පටහැනිව අභ්‍යන්තර විගණන අංශයේ සේවයේ නියුතු විගණන සහකාර නිලධාරීන් දෙදෙනෙකු පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව පාලක සභාව අනුමැතිය මත ස්ථිර කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.2 ඡේදය	උපලේඛනගත නිවාසවල පදිංචි අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 9 දෙනෙකුගෙන් නිවාස කුලී අයකිරීමකින් තොරව හා අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩලයේ අනෙකුත් නිවාස ලාභීන් දෙදෙනෙකුගෙන් මාසිකව පිළිවෙලින් රු.500 හා රු.2,000 බැගින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව නිවාස කුලී අයකර තිබුණි.
(ඇ) 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපියෙහි 3.3 ඡේදය	සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් විගණිත දිනය වූ 2023 මාර්තු 31 වන දින වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
1996 බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 3(i) හා 3(v)වගන්තිය	බුදුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම යන පරමාර්ථය මුල් කරගෙන විශ්වවිද්‍යාලයේ සියලු ඉගැන්වීම් හා පාඨමාලා කටයුතු සිදු විය යුතු අතර වුවද එයට පටහැනිව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය මඟින් ජෝතිෂ්‍ය උසස් සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (Enterprise Resource Planning) ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පිළියෙල කර තිබුණු ලංසු ලියකියවිලිවලට අනුව ජයග්‍රාහී ලංසුකරු, මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසාන වර්ෂ තුනෙහි වාර්ෂික පිරිවැටුම රු.මිලියන 50 ක් ඉක්මවා තිබිය යුතු වුවද, එම අවශ්‍යතාවය සපුරා නොතිබුණු ලංසුකරුවෙකු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරා ගෙන තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 8 ක් වූ අතර ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව 2017 ජූනි 01 දිනෙන් ආරම්භ කර 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු විය. එහෙත් 2023 මාර්තු 31 දින වන විට රු.මිලියන 4 ක් වැයකර තිබුණ ද පද්ධතිය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) කොන්ත්‍රාත් වටිනාකම රු.384,409,981 ක් වූ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බහුකාර්යය ගොඩනැඟිල්ල ඉදිකිරීම 2020 මැයි 22 දින ආරම්භ කර 2022 මැයි 01 දිනෙන් අවසන් කිරීමට ගිවිසුම්ගත වී තිබුණද 2023 අප්‍රේල් 30 දින වන විටත් දින දිර්ඝ කරමින් පැවතියද පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් අතරමග නවතා දමා තිබුණි. 2023 ජනවාරි 13 දිනට විගණනය විසින් කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී නොකරන ලද වැඩ වෙනුවෙන් හා බිල්පත් සඳහා අධි ගෙවීම් හේතුවෙන් රු.6,603,970ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

2.3 අනෙකුත් කරුණු

2020 ජනවාරි 14 දින රු.80,843,406 ක පිරිවැයක් දරා වැඩ නිම කර තිබූ විදේශ සිසුන් 25 දෙනෙකු සඳහා වූ නේවාසිකාගාරය විගණිත දිනය වූ 2023 මාර්තු 15 දින වන විට ඉදිකිරීම් නිමකර වසර 03 කට වඩා කාලයක් ගත වී තිබුණද එක් සිසුවෙකු පමණක් නේවාසිකව සිටීම හේතුවෙන් එම ගොඩනැඟිල්ල හා පිරිවැය රු.3,411,000 ක් වූ විදුලි හා සවිකිරීම්ද දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතිණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට අදාළව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
1. මූල්‍ය ප්‍රකාශන	1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම	(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්හි ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු. 35,695,254 ක් වූ වත්කම් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ජංගම නොවන වත්කම්හි ප්‍රත්‍යාගණනය කිරීමේ කාර්ය 2022 වර්ෂයෙහි ආරම්භ කරන ලද අතර, ඒ අනුව මෝටර් රථ සහ පුස්තකාල පොත් 2022.12.31 ප්‍රත්‍යාගණනය කරන ලදී. ඒ අනුව මෙම වත්කම් 2023 වර්ෂය තුල ප්‍රත්‍යාගණනය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
		(ආ) සමාලෝචිත වර්ෂය තුල්දී ලැබී තිබූ රු. 23,110,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස ලැබුණු රු. 23,110,000.00 මුදලින් රු. 3,357,260.00 ක ප්‍රමාණයක් මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇත. ඉතිරි මුදල ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් දරා ඇති අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් කර ඇත. 2023 වර්ෂයේ සිට ජංගම නොවන වත්කම් වෙනුවෙන් දරන මුදල ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීමට සටහන් කරගෙන ඇත.
		(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 117 (ඇ) ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් දේපළ පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනම අයිතමයක් ලෙස පෙන්නුම් කළ යුතු වුවද පිරිවැය රු. 495,140 ක් වූ පරිගණක මෘදුකාංග වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.	මෙහි ශුද්ධ පොත් අගය පසුගිය වසර කිහිපයක සිට ශූන්‍ය වී ඇති බැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අස්පෘශ්‍ය වත්කමක් ලෙස වෙනම දක්වා නොමැත. කෙසේ නමුදු 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෙම අයිතමය අස්පෘශ්‍ය වත්කම් ලෙස සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ.

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව	2.2.2. 2012 අංක 15 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනත 11 ඡේදය (ආ) (XV)	(අ) අදාළ සංශෝධන පනත අනුව පරිවාස කාලය අවසානයේ නිලධාරීන් ස්ථිර කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය යුතු වූවද ඊට පටහැනිව අභ්‍යන්තර විගණන අංශයේ සේවයේ නියුතු විගණන සහකාර නිලධාරීන් දෙදෙනෙකු පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව පාලක සභාව අනුමැතිය මත ස්ථිර කර තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති වක්‍රලේඛ අංක 903 අනුව මෙම සේවකයන් බඳවාගැනීම සිදුකර ඇති නමුදු එම වක්‍රලේඛයෙහි ස්ථිර කල යුතු ආකාරය දක්වා නොමැත. ඒ අනුව ස්ථිර කිරීමේ දී පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට බඳවා ගැනීමේ වක්‍රලේඛය තුළ නොමැත. එබැවින් අදාළ නිලධාරීන් දෙදෙනාගේ පරිවාස කාලය අවසානයේ දී 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ 111 පරිච්ඡේදයේ 21.1.4 වගන්ති ප්‍රකාරව පාලක සභාව විසින් ස්ථිර කිරීමට අදාළ කටයුතු සිදුකර ඇත. කෙසේ නමුත් විගණන සහකාර තනතුර සඳහා බඳවා ගෙන ඇති සේවකයින් සේවයෙහි ස්ථිර කිරීමේ දී පරීක්ෂණයක් පැවැත්වීම සම්බන්ධයෙන් වෙනත් ජාතික විශ්වවිද්‍යාලයක් වෙතින් විමසීමට කටයුතු කර ඇත.
	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන දසංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.2 ඡේදය	(ආ) උපලේඛනගත නිවාසවල පදිංචි අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 09 දෙනෙකුගෙන් නිවාස කුලී අයකිරීමකින් තොරව හා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනෙකුත් නිවාස ලාභීන් දෙදෙනෙකුගෙන් මාසිකව පිළිවෙලින් රු. 500 හා රු. 2000 බැගින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව නිවාස කුලී අයකර තිබුණි.	මෙම විශ්වවිද්‍යාලයේ ආචාර්ය ස්වාමීන් වහන්සේලා සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම සම්බන්ධයෙන් හා ගාස්තු අයකරගැනීම සම්බන්ධයෙන් නියමාවලියක් සකස් කිරීම ඇතුළු කාර්යයන් සඳහා කටයුතු කිරීමට 265 වන පාලක සභාව විසින් කාර්ය මණ්ඩල නේවාසික කමිටුවක් (S.R.C.) පත් කරන ලදී. ඒ අනුව එකී කාර්ය මණ්ඩල නේවාසික කමිටුව විසින් සකස් කරන ලද නේවාසිකාගාර නියමාවලී සහ ගාස්තු ඇතුලත් වාර්තාව 2023.02.10 දින පැවති 271 පාලක සභාව විසින් අනුමත කර ඇත. ඒ අනුව පත්කළ කාර්ය මණ්ඩල නේවාසික කමිටුව විසින් එක් එක් නේවාසිකාගාරයන්හි පවතින පහසුකම් සැලකිල්ලට ගනිමින් සකස්කළ වාර්තාව පදනම් කරගෙන නව ගාස්තු 2023 අප්‍රේල් මස සිට නේවාසිකයන්ගෙන් අයකරගැනීමට කටයුතු කර ඇත.
	2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන වක්‍රලේඛ ලිපියෙහි 3.3 ඡේදය	(ඇ) සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතු වූවත් විගණිත දිනය වූ 2023 මාර්තු 31 වන දින වන විටත් එපරිදි කටයුතු කර නොනිබුණි.	2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තාව 2023.05.30 දින විගණන කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
	2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තිය	1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 3 (i) හා 3(v) වගන්තියේ දැක්වෙන බුදුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම යන පරමාර්ථය මුල් කරගෙන විශ්වවිද්‍යාලයේ සියලු ඉගැන්වීම් හා පාඨමාලා කටයුතු සිදු විය යුතු අතර වුවද එයට පටහැනිව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ජෝතිෂ්‍ය උසස් සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි.	1996 බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 3 (v) වගන්තිය " බෞද්ධ සංස්කෘතික සහ එහි අගය ප්‍රවර්ධනය කිරීම" යන පරමාර්ථය ප්‍රකාරව ජ්‍යෝතිෂ්‍ය යනු ලාංකීය බෞද්ධ සංස්කෘතියට අනුගත වූවක් බැවින් සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමැතියෙන් ජ්‍යෝතිෂ්‍ය උසස් සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කර ඇත. ඒ අනුව මෙය විශ්වවිද්‍යාලීය පනතේ අරමුණු හා පරමාර්ථ සමග අනුගතවේ.
	2.2.4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තිය	(අ)සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (Enterprise Resource Planning) ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පිළියෙල කර තිබුණු ලංසු ලියකියවිලිවලට අනුව ජයග්‍රාහී ලංසුකරු, මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසාන වර්ෂ තුනෙහි වාර්ෂික පිරිවැටුම රු. මිලියන 50 ක් ඉක්මවා තිබිය යුතු වූවද, එම අවශ්‍යතාවය සපුරා නොතිබුණු ලංසුකරුවෙකු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරා ගෙන තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 8 ක් වූ අතර ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව 2017 ජූනි 01 දිනෙන් ආරම්භ කර 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු විය. එහෙත් 2023 මාර්තු 31 දින වන විට රු. මිලියන 4 ක් වැයකර තිබුණද අතර පද්ධතිය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි.	සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (ERP) මෙම විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාලයම ආවරණය වන පරිදි අන්තර්ජාල සම්බන්ධතාවයක් නොමැති වූ බැවින් නව අන්තර්ජාල පද්ධතියක් ස්ථාපනය කිරීමට කටයුතු සිදුකරන ලදි. එම පද්ධතිය 2023.06.06 දින විශ්වවිද්‍යාලයට භාර ගන්නා ලදී. ඒ අනුව සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතියේ දෝෂ කඩිනමින් නිවැරදි කර විශ්වවිද්‍යාලයට භාර ගැනීමට කටයුතු සිදු කරනු ලබන අතර මෙම ව්‍යාපෘතිය ඵලදායී ලෙසත්, කාර්යක්ෂම ලෙසත් ඉටුකර ගැනීමට අවශ්‍ය පියවර විශ්වවිද්‍යාලය විසින් ගනිමින් සිටියි.
		(ආ) කොන්ත්‍රාත් වටිනාකම රු. 384,4089,981 ක් වූ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බහුකාර්යය ගොඩනැඟිල්ල ඉදිකිරීම 2020 මැයි 22 දින ආරම්භ කර 2022 මැයි 01 දිනෙන් අවසන් කිරීමට ගිවිසුම්ගත වී තිබුණද 2023 අප්‍රේල් 30 දින වන විටත් දින දීර්ඝ කරමින් පැවතියද පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් අතරමඟ නවතා දමා තිබුණි. 2023 ජනවාරි 13 දිනට විගණනය විසින් කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී නොකරන ලද වැඩ	මෙම කොන්ත්‍රාත්කරු විසින් 2023.04.25 දින මෙම ව්‍යාපෘතියෙහි වැඩ කටයුතු නැවත ආරම්භ කර ඇති බැවින් ඉදිරියේ දී ඔබගේ නිරීක්ෂණ අනුව මේ පිළිබඳව අවධානය යොමුකොට අදාළ ගෙවීම් කටයුතු සඳහා නිර්දේශය ලබා දෙන බව දන්වා සිටිමි. කෙසේ නමුත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද 08 වන බිල්පතට අදාල රු. මිලියන 13.4 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් මෙතෙක් ගෙවීම් කර නොමැත. ඒ අනුව කොන්ත්‍රාත් ආයතනය වෙත රු. මිලියන 6.6 ක අධි ගෙවීමක් සිදු වී නොමැත.

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
		වෙනුවෙන් හා බිල්පත් සඳහා අධි ගෙවීම් හේතුවෙන් රු.6,603,970 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.	
	2.3 අනෙකුත් කරුණු	2020 ජනවාරි 14 දින රු. 80,843,406 ක පිරිවැයක් දරා වැඩ නිම කර තිබූ විදේශ සිසුන් 25 දෙනෙකු සඳහා වූ නේවාසිකාගාරය විගණිත දිනය වූ 2023 මාර්තු 15 දින වන විට ඉදිකිරීම් නිමකර වසර 03 කට වඩා කාලයක් ගත වී තිබුණද එක් සිසුවෙකු පමණක් නේවාසකව සිටීම හේතුවෙන් එම ගොඩනැඟිල්ල හා පිරිවැය රු. 3,411,000 ක් වූ විදුලි හා සවිකිරීම්ද දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතිණි.	විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා ඒකකය මගින් ක්‍රියාත්මක විදේශීය සිසුන් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ 2022.10.13 දින සිට ඉන්දියානු ජාතික Ngithon Tikhak ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ BUSL/FS/20/21/001 ලියාපදිංචි අංක යටතේ බඳවාගෙන මේවන විට අදාළ අධ්‍යයන කටයුතු සිදු කෙරෙමින් පවතියි. තවද 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා විදේශීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා තිදෙනෙකු විශ්වවිද්‍යාලය වෙත අයදුම්පත් යොමු කර තිබූ අතර එම ස්වාමීන් වහන්සේලාගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රවේශ කමිටුව මැයි මාසයේදී පවත්වන ලද අතර එම විදේශීය ස්වාමීන් වහන්සේලා බඳවා ගැනීමට අදාළ ඉදිරි කටයුතු මේවන විට සිදු කෙරෙමින් පවතියි.

මෙයට,
ශාසනාලයැති,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්ථවිර,
මහෝපාධ්‍යායයන් වහන්සේ.



වාර්ෂික මූල්‍ය ප්‍රකාශය

2022

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

අනුරාධපුර.

2022 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ
වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සඳහා වූ ව්‍යවස්ථාපිත වාර්තාව

01. 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල සංශෝධිත පනතේ 46 වගන්ති ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති ප්‍රකාරව 2022 වර්ෂයේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ගිණුම් වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

02. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPAS) අනුකූලව කටයුතු කර ඇති අතර විශේෂයෙන්ම සඳහන්කර ඇති අවස්ථාවල හැර පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ ප්‍රතිපත්ති ඡංගම වර්ෂයේ දීත් නොවෙනස්ව අනුගමනය කර ඇත.

03. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයයේ 2022 වර්ෂයේ ගිණුම් වාර්තාවෙන් පැහැදිලිවන පහත සඳහන් සටහන් උපුටා දක්වනු ලැබේ.

i. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට පුනරාවර්තන සහ මූලධන ආධාර වශයෙන් රජයෙන් රු.418,310,000/= ක මුදලක් පහත සඳහන් පරිදි ලැබී ඇත.

පුනරාවර්තන	රු.395,200,000
මූලධන වත්කම් පුනරුත්ථාපන	රු .23,110,000
	රු.418,310,000

ii. වර්ෂය තුළදී අභ්‍යන්තර කටයුතු වලින් මිලියන 18.94 මුදලක් උපයාගෙන ඇත.

iii. වර්ෂය තුළ මෙහෙයුම් ව්‍යයම්වල එකතුව මිලියන 537.40කි. මෙය මූලික වශයෙන් පුද්ගල පඩිනඩි හා විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් වන අතර එම මුදල මිලියන 308.08 කි.

iv. පවත්නා වර්ෂයේ මෙහෙයුම් ඌනතාවක් වාර්තා වන අතර එය රු. මිලියන 19.42 කි. මෙය ස්ථාවර වත්කම් ක්ෂය වෙන්කිරීම්, පාරිතෝෂික වෙන්කිරීම්, උපචිත ව්‍යයම් සහිතව සහ ප්‍රාග්ධන අරමුදල් හායනයේ සහ විශේෂ අරමුදල් / පරිත්‍යාග හායන ආදායම් බලපෑම හැර වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය වන අතර එය රු. මිලියන 34.98 වේ.

v. වාර්තා කරනු ලබන දින වන විට දේපල,පිරියත හා උපකරණවල ශුද්ධ පොත් අගය රු. මිලියන 1679.41 වේ. ඒවායේ සංචලනය සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශනයන් සඳහා වන සටහන 2හි දක්වා ඇත.

vi. වාර්තා කරනු ලබන දින වන විට නොනිමි වැඩවල අගය රු. මිලියන 182.69කි. මෙම ශේෂය මූලික වශයෙන් ඉදිවෙමින් පවතින බහුකාර්ය ගොඩනැගිල්ලි සඳහා ඉදිවන නිවාස වෙනුවෙන් දැරූ මුදල් වේ.

vii. වර්ෂ අවසානයේ බැංකු ඡංගම ගිණුම් ශේෂය රු. 4,754,475 වේ. මෙහි පුනරාවර්තන ව්‍යයම් සඳහා වන රු. 4,314,440 මුදලකින් සමන්විත වන අතර එම මුදල උපචිත ව්‍යයම් සඳහා 2023 වර්ෂයේ ජනවාරි මාසය තුළ සම්පූර්ණයෙන් වැයකර ඇත.

viii. වාර්තා කරනු ලබන දිනට වත්කම් ප්‍රත්‍යාගනන සංචිතය රු. මිලියන 98.87 වේ. ප්‍රවර්තන වර්ෂය තුල මෝටර් රථ සහ පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කර ඇත.

ix. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා අභ්‍යන්තර විභාගවලදී දක්වන සමත්කම් ඇගයීම සඳහා ත්‍යාග ලබාදෙන අතර ඒ සඳහා ත්‍යාග අරමුදල් පිහිටුවා ඇත. වාර්තා කරනු ලබන දිනට මෙහි අගය රු.මිලියන 4.39 වේ. මේ සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 14.1 දක්වා ඇත.

04. 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාසක හික්ෂු විශ්වවිද්‍යාල සංගෝධන පනතේ අංක 30 වගන්තියට අනුව සේවක අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය විසින් පවත්වා ගෙන යනු ලැබේ. ඒ සඳහා වන ගිණුම් වාර්තා වෙනමම විධියෙල් කරනු ලබන අතර එම වාර්තාව මෙම ගිණුම් සමග ඇතුළත් කර ඉදිරිපත් කර ඇත. වාර්තා කරන ලබන දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂය රු. මිලියන 400.95 වන අතර එම මුදල් ස්ථාවර තැන්පතුවල, භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇති අතර සාමාජිකයන් හට ණය ලබාදීමද කර ඇත. වර්ෂය තුළ සාමාජිකයන්ගේ දායක මුදල් වශයෙන් රු. මිලියන 51.50 ක මුදලක් ලැබී ඇත.

05. පුනරාවර්තන වැය ශීර්ෂයන්හි සත්‍ය වියදම් සහ අයවැය වෙන්කිරීම් අතර විචල්‍යයන්, පාලක සභාවේ අනුමැතිය ඇතිව, ප්‍රතිපාදන ගළපා තුලනය කර ඇත.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්ථවිර
මහෝපාධ්‍යායයන් වහන්සේ
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
අනුරාධපුර
ශ්‍රී ලංකාව

.....

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනු නායක ස්ථවිර
මහෝපාධ්‍යායයන් වහන්සේ

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 වන දිනට	පිටු අංකය	සටහන්	2022 (රු.)	2021 (රු.)
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	14	2	1,679,408,664	1,722,676,775
නොනිමි වැඩ	15	3	182,689,767	163,704,136
ආයෝජන	15-16	4	26,048,936	22,677,779
ලැබිය යුතු ගෙවීම	16	7	10,168,898	9,758,938
සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන ගිණුම	42-49	37	400,952,320	327,180,376
			2,299,268,585	**2,245,998,004**
ජංගම වත්කම්				
තොගය	16	5	6,883,203	2,897,449
අත්තිකාරම් සහ තැන්පතු	16	6	44,109,715	54,843,564
ලැබිය යුතු ගෙවීම	16-17	7	14,056,082	7,921,969
ඉදිරියට කළ ගෙවීම්	18	8	865,866	981,474
කෙටිකාලීන ආයෝජන	15	4.1	51,245,133	37,759,882
බැංකුවෙහි ඇති මුදල්	18	9	5,474,925	8,028,911
			122,634,924	**112,433,249**
මුළු වත්කම්			**2,421,903,509**	**2,358,431,254**
හිමිකම් සහ වගකීම්				
සංචිත				
ප්‍රාග්ධන සංචිතය	7		1,525,341	1,525,341
වත්කම් ප්‍රතිඇගයීම් සංචිතය	7		98,866,429	28,507,469
පොදු සංචිතය	7		(240,100,355)	(336,384,356)
ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ සංචිතය	18	10	11,168,909	9,232,925
විශේෂ අරමුදල් සහ පරිත්‍යාග	19	13	202,657,724	330,836,970
			74,118,048	**33,718,349**
ප්‍රාග්ධනය				
ප්‍රාග්ධනිත වූ මූලධන ආධාර	19	11	1,501,574,895	1,574,159,852
ප්‍රාග්ධනිත නොවූ මූලධන ආධාර	19	12	225,829,482	217,577,700
			1,727,404,377	**1,791,737,552**
ජංගම නොවන වගකීම්				
සේවක අර්ථසාධක අරමුදල්	42-49	37	400,952,320	327,180,376
නඩාග හා අනෙකුත් අරමුදල්	20-21	14	40,160,240	36,112,541
පාරිතෝෂික වෙන් කිරීම්	21	15	89,659,843	87,060,297
			530,772,403	**450,353,213**
ජංගම වගකීම්				
ගෙවිය යුතු පාරිතෝෂික	21	15	7,651,455	3,934,711
නඩාග හා අනෙකුත් අරමුදල්	20-21	14	1,706,960	-
විවිධ ණය හිමියෝ	21	16	13,666,901	14,041,278
නොනිමි බාහිර /අභ්‍යන්තර පාඨමාලා	22-28	17	27,947,989	20,638,247
යැදවුම් හා ඇප තැන්පතු	29	18	22,953,625	29,673,109
උපචිත වියදම්	30	19	15,681,751	14,334,795
			89,608,681	**82,622,140**
මුළු හිමිකම් සහ වගකීම්			**2,421,903,509**	**2,358,431,254**

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සකස් කර ඉදිරිපත් කර ඇත.

.....
ජී.ආර්. තුෂාන් අනුරුද්ධ
මූලාධිකාරී

පිටු අංක 8 සිට 49 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ වගකීමයි. මෙම ගිණුම් ප්‍රකාශ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කර ඇති අතර පාලක සභාව වෙනුවෙන් අප විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අත්සන් කරන ලදී.

.....	.....	.....	.....
යූ.ඩී. දොඩන්වල	පේදෙණි මහාචාර්ය පූජ්‍ය කහන්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්ථවිර	මහාචාර්ය ගාමිණී සේනානායක	මහාචාර්ය කේ.ඩී. කරුණාරත්න
ලේඛකාධිකාරී	මහෝපාධ්‍යායන් වහන්සේ	පාලක සභා සාමාජික	පාලක සභා සාමාජික

10/03/2023
අනුරාධපුර

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය	...ටු ...කය	සංඛ්‍යා	2022 (රු.)	2021
භාණ්ඩාගාර ප්‍රතිපාදන			-	
පුනරාවර්තන ප්‍රතිපාදන			395,200,000	341,400,000
භාණ්ඩාගාර ප්‍රතිපාදන -පුනරුත්ථාපන			1,552,058	16,903,751
භාණ්ඩාගාර ප්‍රතිපාදන -හැකියා වර්ධනය			80,000	276,834
භාණ්ඩාගාර ප්‍රතිපාදන -පර්යේෂණ හා සංවර්ධන			1,725,202	742,902
ප්‍රාග්ධන අරමුදල් භායනය			84,085,915	77,003,356
			482,643,175	**436,326,843**
අනොකුත් ආදායම්				
ආයෝජන පොලී	31	20	9,055,079	3,398,061
ණය පොලී			602,114	576,634
දේදල කුලී			1,897,400	992,598
විවිධ ආදායම්			5,358,424	2,030,695
ශිෂ්‍ය ලියාපදිංචි (අභ්‍යන්තර)			943,456	761,175
විභාග ගාස්තු ආදායම්			95,550	160,528
වත්කම් / තොග ඉවත්කිරීමේ ලාභය			23,622	108,422
ප්‍රකාශන සඟරා අලෙවි ආදායම්			6,360	-
විශේෂ අරමුදල් / පරිත්‍යාග භායන ආදායම්			16,396,218	-
උපාධි උත්සව ආදායම්			33,500	751,500
දඩ මුදල් ආදායම්			125,823	24,031
ලිපි ද්‍රව්‍ය ආදායම්			849	319
ප්‍රවාහන ගාස්තු ආදායම්			799,621	542,573
			35,338,016	**9,346,536**
මෙහෙයුම් ආදායම්වල එකතුව			**517,981,191**	**445,673,379**
මෙහෙයුම් වියදම්				
පුද්ගල පඩිනඩි හා විශ්‍රාම ප්‍රතිලාභ	31	21	308,082,621	283,124,729
ගමන් වියදම්	31	22	4,212,103	2,863,864
සැපයුම්	31	23	11,468,452	5,416,267
අලුත්වැඩියා නඩත්තු කටයුතු	31	24	9,275,533	4,518,857
ගිවිසුම් ගත සේවා	31	25	42,134,579	35,658,851
පුහුණු හා සංවර්ධන වියදම්	32	26	871,228	560,769
ශිෂ්‍යාධාර	32	27	20,251,338	7,995,950
විවිධ පුනරාවර්තන වියදම්	32	28	6,713,297	7,252,223
තොග අගය ලියාහැරීම තොග සඳහා වෙන්කිරීම්			310	15
වත්කම් පරිත්‍යාග කිරීමේ පාඩුව			112,755	19,108,314
පුනරාවර්තන ස්වභාවයේ වියදම්			1,552,058	3,758,368
පුනරුත්ථාපන ප්‍රතිපාදන යටතේ දරන ලද හැකියා වර්ධන වියදම්			80,000	305,534
පර්යේෂණ හා සංවර්ධන			3,725,202	2,090,107
ස්ථාවර වත්කම් ක්ෂය	32	29	128,924,993	120,311,895
මෙහෙයුම් වියදම්වල එකතුව			**537,404,469**	**492,965,743**
ඌණතාව			**(19,423,278)**	**(47,292,364)**

ජී.ආර්. තුෂාන් අනුරුද්ධ
මූල්‍යාධිකාරී

යූ.ඩී. ...ත්වල
ලේඛන නිලධාරී

මහාචාර්ය පූජ්‍ය ...කනත්තෙගොඩ සද්ධාරතන
නායක ස්ථවිර - මහෝපාධ්‍යායයන් වහන්සේ

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		2022	2021
ක්‍රියාකාරී කටයුතුවලින් ලද මුදල්			
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ඌණතාවය		19,423,278	(47,292,364)
මුදල් සම්බන්ධ නොවන ගණුදෙනු			
ක්ෂය වීම්		128,924,994	120,311,894
පාරිතෝෂික		10,269,323	10,686,974
පොළී ආදායම්		(9,055,078)	(3,398,061)
දේපල,පිරියත හා උපකරණ බැහැර කිරීමේ ඵලාභය		112,755	19,108,314
දේපල,පිරියත හා උපකරණ බැහැර කිරීමේ අලාභය		(23,622)	(108,422)
තොග අගය ලියා හැරීම		310	15
ප්‍රාග්ධන අරමුදල් හායනය		(100,498,303)	(77,003,356)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමට පෙර ක්‍රියාකාරී ඌණතාවය/අතිරික්තය		**49,153,657**	**22,304,994**
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම.			
(වැඩි වීම)/ අඩු වීම	තොගය	(3,986,064)	(964,624)
(වැඩි වීම)/ අඩු වීම	ලැබිය යුතු ශේෂ	(5,127,454)	15,212,669
(වැඩි වීම)/ අඩු වීම	ඉදිරියට කළ ගෙවීම්	115,608	(4,287)
(වැඩි වීම)/ අඩු වීම	අත්තිකාරම් හා තැන්පතු	10,733,849	16,405,643
(වැඩි වීම)/ අඩු වීම	විවිධ ණය හිමියෝ	(702,569)	1,545,336
(වැඩි වීම)/ අඩු වීම	උපචිත වියදම්	1,603,530	3,432,069
(වැඩි වීම)/ අඩු වීම	රැඳවුම් හා ඇප තැන්පතු	(6,700,777)	14,088,073
නොනිමි බාහිර පාඨමාලා		12,603,535	(6,377,860)
පාරිතෝෂික ගෙවීම්		(3,934,711)	(8,086,198)
ක්‍රියාකාරී කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**4,604,947**	**35,250,821**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම		(3,151,098)	(34,957,906)
දේපල පිරියත හා උපකරණ විකිණීම		25,162	350,131
නව ආයෝජන		(35,567,100)	(729,000)
පොළී ආදායම්		4,135,252	4,138,874
ප්‍රාග්ධන පොළිය ප්‍රාග්ධනිත කිරීම		(4,161,343)	(3,425,927)
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම		30,745,075	(624,702)
නොනිමි වැඩ		(26,124,710)	(125,647,992)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**(34,098,762)**	**(160,896,522)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවහ			
රජයේ ප්‍රදාන			
කාර්යාල උපකරණ ගෘහ භාණ්ඩ හා පුස්තකාල පොත්		3,902,916	12,584,126
ඉඩම් හා ගොඩනැගිලි		15,865,996	105,492,387
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**19,768,912**	**118,076,513**
මුදල් හෝ මුදල් වලට සමාන දැහි වැඩිවීම		39,428,754	14,735,806
වර්ෂ ආරම්භක මුදල් හා මුදල් වලට සමාන දෑ වල එකතුව		21,210,514	6,256,797
වර්ෂ අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ වල වටිනාකම		**60,639,268**	**20,992,603**

වර්ෂ ආරම්භක මුදල් හා මුදල් වලට සමාන දෑ වල එකතුව

බැංකුවෙහි ඇති මුදල් (9)	5,474,925	8,028,911
මාස තුනට අඩු ස්ථාවර තැන්පතු (4.1)	16,317,787	12,963,692
	21,792,712	**20,992,603**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ
විසර්ජන ගිණුම් ප්‍රකාශය

විස්තරය	2022 (රු.)	2021 (රු.)
2022.01.01 දිනට ශේෂය	(336,384,356)	(295,693,539)
පසු ගිය කාලපරිච්ඡේදයට අදාළ ගැලපීම	-	-
වර්ෂය තුල බැහැර කළ දේපල, පිරියත හා උපකරණවලට අදාල ගැලපීම	-	11,622,000
වර්ෂයේ අනෙකුත් ගැලපීම	1,365,532	(5,020,453)
විශේෂ අරමුදල් / පරිත්‍යාග	114,341,746	
වර්ෂයේ ඌණතාව	(19,423,278)	(47,292,364)
2022.12.31 දිනට ශේෂය	**(240,100,356)**	**(336,384,356)**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය	ප්‍රාග්ධන සංචිතය	වත්කම් ප්‍රත්‍යාගනන සංචිතය	පොදු සංචිතය	ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ සංචිත	ප්‍රාග්ධනය	විශේෂ අරමුදල් හා පරිත්‍යාග	මුළු ස්කන්ධය
2020.12.31 දිනට ශේෂය	**1,525,341**	**45,343,906**	**(295,693,539)**	**8,797,504**	**1,750,664,395**	**326,012,457**	**1,836,650,064**
වර්ෂය තුළ බැහැර කළ ගොඩනැගිලි වලට අදාල ගැලපීම	-	(11,622,000)	11,622,000	-	-	-	-
රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ගෙවිය යුතු මුදල ගැලපීම	-	(5,214,437)	-	-	-	-	(5,214,437)
පොළී ආදායම් ණය අරමුදලට, ත්‍යාග අරමුදලට මාරු කිරීම	-	-	(3,996,742)	570,739	-	-	(3,426,003)
වර්ෂය තුල ප්‍රාග්ධනිත කල වත්කම්	-	-	-	-	41,073,157	-	41,073,157
පරිත්‍යාග ලැබීම්			-	-	-	4,824,513	4,824,513
වෙනත්	-	-	(1,023,711)	(135,318)	-	-	(1,159,029)
වර්ෂයේ ඌනතාව	-	-	(47,292,364)	-	-	-	(47,292,364)
2021.12.31 දිනට ශේෂය	**1,525,341**	**28,507,469**	**(336,384,356)**	**9,232,925**	**1,791,737,552**	**330,836,970**	**1,825,455,901**
ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලිවලට අදාලව ගැලපීම්	-	(7,045,649)	-	-	-	-	(7,045,649)
රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ගෙවිය යුතු මුදල ගැලපීම	-	(485,796)	-	-	-	-	(485,796)
පොළී ආදායම් ණය අරමුදලට, ත්‍යාග අරමුදලට මාරු කිරීම	-	-	(896,850)	435,984	-	-	(460,866)
පුස්තකාල පොත්	-	18,034,738	-	-	-	-	18,034,738
මෝටර් වාහන	-	59,855,667	-	-	-	-	59,855,667
වර්ෂය තුල ප්‍රාග්ධනිත කල වත්කම්	-	-	-	-	(64,333,175)	-	(64,333,175)
විශේෂ අරමුදල්/පරිත්‍යාග යටතේ පැවති වත්කම් හායනය	-	-	114,341,742	-	-	(130,737,960)	(16,396,218)
වෙනත්	-	-	2,262,387	1,500,000	-	-	3,762,387
පරිත්‍යාග ලැබීම්	-	-	-	-	-	2,558,714	2,558,714
වර්ෂයේ ඌනතාව	-	-	(19,423,278)	-	-	-	(19,423,278)
2022.12.31 දිනට ශේෂය	**1,525,341**	**98,866,429**	**(240,100,355)**	**11,168,909**	**1,727,404,377**	**202,657,724**	**1,801,522,425**

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

1.1 සංස්ථාපිත තොරතුරු

1.1.1 වාර්තාකරණ ආයතන

1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත මගින් ''බුද්ධශ්‍රාවක විශ්වවිද්‍යාලය'' ස්ථාපනය කරන ලදි. මෙය පිහිටුවීමේ අරමුණ වී ඇත්තේ භික්ෂූන් වහන්ෙ විශ්වවිද්‍යාල මට්ටමේ උසස් අධ්‍යාපනයක් ලබාදීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික ස සඳහා ද විධි විධාන සැලැස්වීම සඳහා වේ. 2012 අංක 15 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවි (සංශෝධිත) පනත මගින් විශ්වවිද්‍යාලය නම '' ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය'' ලෙස ෙ කරන ලදි. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර යන ස්ථානයේ පිහිටා ෙ

1.2. ගිණුම්කරණ පදනම

1.2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට (SLPAS) අනුකූලව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනු ඇත. ඒ අනුව පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ වාර්තා පිළියෙල කරනු ලැබේ.

i. මූල්‍ය තත්ව ප්‍රකාශය
ii. මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය
iii. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
iv. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

1.2.2 මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ද සභාව සතුවේ.

1.2.3 මූල්‍ය ප්‍රකාශ සඳහා අනුමැතිය.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා පාලක ස විසින් බලය පවරන ලදි.

1.2.4 පිළියෙල කිරීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණ හැර ඓතිහාසික පිරිවැය පදනම් කරගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව උපචිත පදනමින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත. දේපළ ි හා උපකරණ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ගිණුම්වලට බලපාන උද්ධමනකාරී සාධක ගැලපුම් කර නැත.

1.2.5 කෘත්‍යායාත්මක හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

ආයතනයේ කෘත්‍යායාත්මක හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් වාර්තා ඉදිරිපත් කර ඇත.

භික්ෂු
ස්ලාට
කරුණු
විද්‍යාල
වෙනස්
ඇත.

කරණ
ගත වී

ාලක

භාව

රාජ්‍ය
පිරියත
මෙම

මූල්‍ය

1.2.6 ප්‍රමාණාත්මකභාවය, හිලව් කිරීම සහ වැටයීම භාවිතය

1.2.6.1 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

එක සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක සමූහය මූල්‍ය ප්‍රකාශවල වෙනම ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අයිතම හැර වෙනස් ස්වරූප අයිතම හෝ කාර්යයන් වෙනම ඉදිරිපත් කර ඇත.

1.2.6.2 හිලව් කිරීම/අතුලම්භ කිරීම.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය වන හෝ අවසර ලබා දෙන විට හැර මූල්‍ය ප්‍රකාශවල සඳහන් වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කර නොමැත.

1.2.6.3 වැටයීම

වෙනත් විදියකින් සඳහන් කර නොමැති විට මූල්‍ය ප්‍රකාශවල සඳහන් වටිනාකම් ආසන්නතම රුපියලට වටයා ඇත.

1.2.7 විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කර ඇති අතර, වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම්, වියදම් අගයන් සහ අසම්භාව්‍ය වගකීම් තීන්දු සාධාරණ යැයි පිළිගත හැකි අපේක්ෂාවන් ඇතුළුව අතීත අත්දැකීම් හා අනෙකුත් සාධක මත අසම්භාව්‍ය වගකීම්, විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් වේ. මේ නිසා සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල, විනිශ්චයන් හා ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා බලපවත්වන උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සකස්කිරීමේදී යොදාගන්නා ලද පහත සඳහන් වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන කළමනාකාරිත්වය විසින් සලකා බලන ලදි.

1.2.7.1 අඛණ්ඩ පැවැත්ම.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව පිළියෙල කරනු ලැබේ.

මීට අමතරව පහත සඳහන් අනාවරණයන් සඳහා විශේෂිත ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගන්නා ලදි.

- දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීම.
- වගකීම් සඳහා වෙන්කිරීම.

1.2.8 සංසන්දනාත්මක තොරතුරු

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සහ ප්‍රවර්ථන වර්ෂයේ තොරතුරු සමග සංසන්දනය කිරීම සඳහා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය අවශ්‍ය අවස්ථාවන්හි දී සංශෝධනය කර ඇත.

1.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.3.1 දේපළ, පිරියත හා උපකරණ

1.3.1.1 හඳුනාගැනීම

වත්කම් හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින විට හා වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම සිදුවේ.

1.3.1.2 මැනීම

ආරම්භයේ දී සියලුම දේපළ, පිරියත හා උපකරණ එහි පිරිවැයට අගය කරනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීමට සෘජුව දායක වන වියදම් හා පසුව දරන වියදම් (නඩත්තු වියදම් හැර) පිරිවැයට ඇතුළත් වේ.

1.3.1.3 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටසක් නිරන්තරයෙන් ප්‍රතිස්ථාපනය කළ යුතු විටදී, නව කොටස් එයට සම්බන්ධ ආයු කාලය අනුව හඳුනාගෙන ඒ අනුව ක්ෂය කරනු ලැබේ. ඉදිරියට යන අළුත්වැඩියා හා නඩත්තු වියදම් මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

1.3.1.4 ප්‍රත්‍යාගණනය

සම්පූර්ණයෙන් වටිනාකම ක්ෂය වී ඇති ශේෂ වටිනාකමක් නොපෙන්වන වත්කම් ප්‍රත්‍යාගණනය කර පොත්වලට ගලපනු ලැබේ.

1.3.1.5 ඉවත් කිරීම

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් විකිණීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ එය භාවිතයෙන් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ නොමැති නම් ඉවත් කිරීම් කරනු ලැබේ. වත්කමක් ඉවත් කිරීම මත හඳුනාගත් කුමන හෝ ලාභයක් හෝ අලාභයක් එම වත්කම ඉවත් කළ කාල පරිච්ඡේදයේ ලාභ හෝ අලාභ තුළ ඇතුළත් වේ.

1.3.1.6 ක්ෂය

වත්කමෙහි ඇස්තමේන්තුගත සළුල ජීවකාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම සිදු කරයි. වත්කමක් ක්ෂය කිරීම ආරම්භ කරන්නේ එම වත්කම ප්‍රයෝජනය සඳහා භාවිතා කළ හැකිවිට දී හෝ ඉදිකළ වත්කමක් සම්බන්ධයෙන් වන විට එම වත්කම් සම්පූර්ණ කළවිට හා භාවිතය සඳහා සූදානම් වූ මාසයේ ආරම්භයේ සිටය. වත්කම ඉවත්කරන වර්ෂයේදී ක්ෂය කිරීම නොකරනු ලබයි.

වත්කම් සඳහා ඇස්තමේන්තුගත ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

• ගොඩනැගිලි	5%	• ජල සැපයුම් පද්ධතිය	10%
• කාර්යාලයීය උපකරණ	20%	• මෙවලම් හා උපකරණ	20%
• ඉගැන්වීමේ උපකරණ	20%	• පරිගණක මෘදුකාංග	20%
• පුස්තකාල පොත්	20%	• ආරක්ෂිත විදුලි පහන්	10%

		පද්ධතිය	
• දැව භාණ්ඩ	10%	• උපාධි ලෝගු	20%
• අභ්‍යන්තර දුරකථන පද්ධතිය	20%	• නාම පුවරු	10%
• යන්ත්‍ර හා පිරියත	10%	• අභ්‍යන්තර මාර්ග පද්ධති	10%
• මෝටර් වාහන	20%	• පරිගණක උපාංග	20%
• කාණු පද්ධතිය	10%		

1.3.2 නොනිමි වැඩ - ප්‍රාග්ධනය

ඉදිකෙරෙමින් පවතින වත්කම් වෙනුවෙන් දැරූ සියලු වියදම් පිරිවැයට දක්වනු ලැබේ. වත්කම් ඉදිකිරීම අවසන් වූ පසු හා භාවිතයට ගැනීමට හැකි තත්ත්වයට පත් වූ විට දේපළ, පිරියත හා උපකරණවල අදාළ වත්කම් වර්ගයට මාරු කරනු ලැබේ.

1.3.3 තොගය

තොග නිකුත් කරනු ලබන්නේ FIFO ක්‍රමයට වේ. මන්දගාමීව සංචලනය වන තොග සඳහා දීමනා වෙන් කරනු ලබයි. අවසාන තොගය ගණනය කිරීමේදී පිරිවැය මත අදාල වටිනාකම ගණනය කරනු ලැබේ.

1.3.4 ආයෝජන

ආයෝජනවලට ඇතුළත් වන්නේ ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනුම්ය. මෙම ආයෝජන දක්වා ඇත්තේ වසර අවසානය දක්වා පිරිවැය ලෙසයි.

1.3.5 පාරිතෝෂික වෙන් කිරීම

පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන සම්පූර්ණ කළ පසු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා සේවා කාලයෙන් වර්ෂයක ගෙවීම් වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශවල පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වසර 5 හෝ වැඩි කාලයක් විශ්වවිද්‍යාලයේ සේවය කළ කාර්ය මණ්ඩලය සඳහා පමණක් ගෙවීම් කරනු ලැබේ.

1.3.6 සේවක අර්ථසාධක අරමුදල

1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ අංක 30 දරන වගන්තියට අනුව සේවක අර්ථසාධක අරමුදල විශ්වවිද්‍යාලය විසින්ම පවත්වාගෙන යනු ලැබේ. මෙම අරමුදල පාලක සභාව විසින් පත්කර ඇති කමිටුවක් මගින් පාලක සභාවේ අධීක්ෂණය යටතේ කළමණාකරනය කරනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල සඳහා වෙනම ගිණුම් ප්‍රකාශ පිළියෙල කරනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදලේ ශේෂය සහ සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන ශේෂය ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ පෙන්වනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ සියලුම කාර්ය මණ්ඩලය මෙම අරමුදලේ සාමාජිකයන් වනු ලැබේ. සියලුම සාමාජිකයන් තම මූලික වැටුපෙන් සහ අනුමත දීමනාවලින් (ජීවන වියදම් දීමනාව සහ අධ්‍යයන දීමනාව හෝ මාසික හිලව් දීමනාව) 10% ක් ද ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය 15% ක් ද එම අරමුදලට මාසිකව බැර කරනු ලැබේ.

මෙම අරමුදලේ ශේෂයෙන් භාණ්ඩාගාර බිල්පත්වල, ස්ථාවර තැන්පතුවල, භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනුම්වල සහ Call Deposit වල ආයෝජනය කරනු ලැබේ.

1.3.7 සේවක භාරකාර අරමුදල

විශ්වවිද්‍යාලයේ සියලුම කාර්ය මණ්ඩලය මූලික වැටුපෙන් සහ අනුමත දීමනාවලින් (ජීවන වියදම් දීමනාව සහ අධ්‍යයන දීමනාව හෝ මාසික හිලව් දීමනාව) 3% ක් සේවක භාරකාර අරමුදලට දායකත්වය සපයනු ලැබේ.

1.3.8 විශේෂිත අරමුදල්

විශ්වවිද්‍යාලයීය පනත, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ සහ අනෙකුත් නීතිමය අවශ්‍යතා මත පහත සඳහන් අරමුදල් පිහිටුවා ඇත.

-මහෝපාධ්‍යාය අරමුදල
-විශ්වවිද්‍යාලයීය සංවර්ධන අරමුදල
-පර්යේෂණ අරමුදල
-ත්‍යාග අරමුදල්
-ගිව්සුම් කඩකල ආචාරවරුන්ගේ සංචිත

1.3.9 පරිත්‍යාග

විවිධ පුද්ගලයින්ගෙන් සහ රජයේ ආයතන වලින් ලැබෙන පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති වීම හේතුවෙන් LKAS -20 : Accounting & for Government Grants and Disclosure of Government Assistance අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ විශේෂ අරමුදල්වල සහ පරිත්‍යාගවල සටහන් කරණු ලබයි. එම පරිත්‍යාග සහ විශේෂ අරමුදල් පහත දක්වා ඇති පරිදි එක් එක් වත්කමේ ආයු කාලය අනුව මූල්‍ය ක්‍රියාකාරීත්ව වාර්තාවට එම වත්කම ප්‍රාග්ධනිත වර්ෂයේ සිට හායනය කරයි.

වත්කම් වර්ගය	හායනය කරනු ලබන කාලය (වසර)	වත්කම් වර්ගය	හායනය කරනු ලබන කාලය (වසර)
• ගොඩනැගිලි	20	• ජල සැපයුම් පද්ධතිය	10
• කාර්යාලයීය උපකරණ	05	• මෙවලම් හා උපකරණ	05
• ඉගැන්වීමේ උපකරණ	05	• පරිගණක මෘදුකාංග	05
• පුස්තකාල පොත්	05	• ආරක්ෂිත විදුලි පහන් පද්ධතිය	10
• දැව භාණ්ඩ	10	• උපාධි ලෝගු	05
• අභ්‍යන්තර දුරකථන පද්ධතිය	05	• නාම පුවරු	10
• යන්ත්‍ර හා පිරියත	10	• අභ්‍යන්තර මාර්ග පද්ධති	10
• මෝටර් වාහන	05	• පරිගණක දෘඩාංග	05
• කාණු පද්ධතිය	10		

1.3.10 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් හා අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී වාර්තා කරන දිනට පසුව සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකනු ලැබේ. හඳුනාගත් සියලුම වගකීම් සඳහා වෙන්කිරීම් හා අදාළ අනාවරණයන් කරනු ලැබේ.

1.3.11 ආදායම් හා වියදම් හඳුනාගැනීම.

අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම භව්‍ය වන විට හා එම ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස මැනීමට හැකි වන විට අයභාරය හඳුනා ගැනේ.

1.3.11.1 භාණ්ඩාගාර ප්‍රතිපාදන

ශ්‍රී ලංකා මහ භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රතිපාදන සියල්ල ලැබීම් පදනම මත මෙහෙයුම් ආදායම් යටතට ගැනේ. මීට අමතරව මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රතිලාභ පුනරුත්තාපන, හැකියා වර්ධනය සහ පර්යේෂණ සහ සංවර්ධන යන වියදම් සඳහා දැරුවහොත් ඊට සමාන මුදලක් ආදායමක් වශයෙන් මෙහෙයුම් ආදායම් යටතේ ලැබීම් පදනම මත හඳුනාගනු ලැබේ.

1.3.11.2 පොලී ආදායම්

පොලී ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනම මතය.

1.3.11.3 මෙහෙයුම් වියදම්

වියදම්වල ස්වභාවය අනුව වියදම් වර්ගීකරණය කරනු ලබන අතර විශේෂයෙන් ප්‍රකාශකර නොමැති අවස්ථාවල උපචිත පදනම අනුව වාර්තා කරනු ලැබේ.

1.3.11.4 විදේශ විනිමය පරිවර්තනය කිරීම

අදාල ගනුදෙනු සඳහා විදේශ මුදල් ප්‍රේශණය කිරීමේදී පැවති විනිමය අනුපාත අනුව ශ්‍රී ලංකා රුපියල්වලට හරවා ඇත. ඒ සඳහා අදාල බැංකු ගාස්තු ද එම වියදම් ශීර්ෂය යටතේම දක්වනු ලැබේ.

1.3.12 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුගමනය කරමින් වක්‍ර ක්‍රමය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිලියෙල කරනු ලබයි.

1.3.13 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල්, ඉතිරි කිරීමේ ගිණුම් ශේෂ, ජංගම ගිණුම් ශේෂ, Call Deposit ශේෂ සහ මාස 03ක් ඇතුලත කල්පිරෙන ස්ථාවර තැන්පතු ශේෂ (කෙටිකාලීන ආයෝජන ලෙස දක්වා ඇති) ඇතුලත් වේ.

2. දේපළ පිරියක හා උපකරණ

		පිරිවැය/ප්‍රත්‍යගණන වටිනාකම						සමුච්චිත ක්ෂය						ශුද්ධ වටිනාකම 2022	ශුද්ධ වටිනාකම 2021
		2022.01.01 දිනට ශේෂය	වර්ෂයේ මිලදී ගැනීම්(රු.)	සංශෝධන මාරු කිරීම්	ප්‍රත්‍යාගණන	වර්ෂයේ ඉවත් කිරීම්	2022.12.31 දිනට ශේෂය	2022.01.01 දිනට සමුච්චිත ක්ෂය	වත්කම් ඉවත්කිරීමේදී ක්ෂය	ප්‍රත්‍යාගණන කිරීමට අදාල ක්ෂය	සංශෝධන මාරු කිරීම	වර්ෂයේ ක්ෂය 2022	2022.12.31 දිනට සමුච්චිත ක්ෂය		
1	ගොඩනැගිලි	1,917,419,510	-	(6,647,970)	-	-	1,910,771,540	468,051,901	-	-	(620,667)	95,566,821	562,998,055	1,347,773,485	1,449,367,609
2	කාර්යාල උපකරණ	12,599,695	249,399	-	-	-	12,849,094	8,824,306	-	-	-	1,232,775	10,057,081	2,792,013	3,775,389
3	ඉගැන්වීම් උපකරණ	9,255,803	-	339,300	-	(262,289)	9,332,814	7,435,553	(151,318)	-	339,300	892,507	8,516,042	816,772	1,820,250
4	පුස්තකාල පොත්	18,966,386	2,648,978	-	-	(24,162)	21,591,202	16,754,435	(23,177)	(18,034,738)	-	1,303,480	-	21,591,202	2,211,951
5	දැව භාණ්ඩ	77,236,521	696,407	-	-	(5,700)	77,927,228	38,231,090	(3,916)	-	-	7,744,723	45,971,897	31,955,331	39,005,431
6	අභ්‍යන්තර දුරකථන පද්ධතිය	6,582,458	443,011	(1,311,250)	-	-	5,714,219	4,295,935	-	-	(1,311,250)	1,008,368	3,993,053	1,721,166	2,286,523
7	යන්ත්‍ර සූත්‍ර උපකරණ	29,554,430	1,702,575	5,538,032	-	-	36,795,037	6,569,931	-	-	620,667	3,905,820	11,096,418	25,698,619	22,984,499
8	මෝටර් රථ	58,284,750	-	-	8,604,250	-	66,889,000	49,210,028	-	(51,251,417)	-	2,041,389	-	66,889,000	9,074,722
9		18,388,242	-	-	-	-	18,388,242	12,520,005	-	-	-	1,838,824	14,358,829	4,029,413	5,868,237
10	උපකරණ	22,581,338	1,167,048	971,950	-	(700)	24,719,636	18,292,061	(700)	-	971,950	2,000,432	21,263,743	3,455,893	4,289,277
11	පරිගණක මෘදුකාංග	495,140	-	-	-	-	495,140	495,140	-	-	-	-	495,140	-	-
12	පරිගනණක දෘඩාංග	26,707,202	2,102,000	-	-	(286,635)	28,522,567	21,514,506	(286,079)	-	-	2,642,234	23,870,661	4,651,906	5,192,696
13	ආරක්ෂක විදුලි පද්ධතිය	23,044,571	-	-	-	-	23,044,571	9,833,363	-	-	-	2,304,457	12,137,820	10,906,751	13,211,208
14	උපාධි ලෝගු/ විජිනිපත්	203,600	-	-	-	-	203,600	157,912	-	-	-	12,140	170,052	33,548	45,688
15	නාම පුවරු	2,828,226	-	-	-	-	2,828,226	1,169,164	-	-	-	282,823	1,451,987	1,376,239	1,659,062
16	අභ්‍යන්තර මාර්ග පද්ධතිය	51,722,043	-	-	-	-	51,722,043	23,499,297	-	-	-	5,172,204	28,671,501	23,050,542	28,222,746
17	කාණු පද්ධතිය	9,778,668	-	(18,707)	-	-	9,759,961	-	-	-	-	975,996	975,996	8,783,965	9,778,668
18	ඉඩම්	123,882,819	-	-	-	-	123,882,819	-	-	-	-	-	-	123,882,819	123,882,819
		2,409,531,402	**9,009,418**	**(1,128,645)**	**8,604,250**	**(579,486)**	**2,425,436,939**	**686,854,627**	**(465,190)**	**(69,286,155)**	**-**	**128,924,993**	**746,028,275**	**1,679,408,664**	**1,722,676,775**

1 2022.12.31 දින විශ්වවිද්‍යාලයේ සියලු මෝටර් රථ සහ පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කර ඇත. ඒ අනුව 2022.12.31 දිනට ශුද්ධ පොත් අගය රු. 7,033,333/- (පිරිවැය රු. 52,284,750/- , ක්ෂය සඳහා වෙන් කිරීම් 51,251,417/-) වූ මෝටර් රථ රු. 66,889,000/- 2022.12.31 දින ප්‍රත්‍යාගණනය කර ඇත. තවද 2022.12.31 දිනට ශුද්ධ පොත් අගය රු. 3,556,464/- වූ පුස්තකාල පොත් රු.21,591,202/- 2022.12.31 දින ප්‍රත්‍යාගණනය කර ඇත.

2 විශ්වවිද්‍යාලයේ භාවිතයේ පැවති ශුද්ධ පොත් අගය රු.110,971.43 (පිරිවැය රු. .262,289.29 සහ ක්ෂය සඳහා වෙන් කිරීම් වූ රු.151,317.86.) Multimedia Projector 2 ක් සොරා ගෙන ඇත. මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ෂණ කටයුතු සිදු කරමින් පවති. තවද අබලි භාණ්ඩ ලෙස වර්ගීකරණය කර තිබූ ශුද්ධ පොත් අගය ශුන්‍ය වූ (පිරිවැය රු. 60,000/-, ක්ෂය සඳහා වෙන් කිරීම් රු. 60,000/-) laptop පරිගණකයක් නැති වී ඇත.

3 මහෝපාධ්‍යායය, පීඨාධිපති, සහ අංශ ප්‍රධාන නිල නිවාස ඉදිකිරීම වෙනුවෙන්, වෙන් කළ ප්‍රතිපාදන (Provisional Sum) තුළ රු. 1,100,000/- ලෙස ඇතුළත් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීමේ කාර්යය 2022.12.31 වන දින වන විට ද කොන්ත්‍රාත්කරු විසින් ඉටු කරගෙන නොමැත. එබැවින් මෙම මුදල රු.1,100,000/- ක මුදල කොන්ත්‍රාත්කරු වෙත 2022.12.31 දින වන විට ගෙවා නොතිබුණි.

4 විදේශීය සිසුන් සඳහා කාමර 25 ක නේවාසිකාගාරයක් ඉදිකිරීමට අදාළව වෙන්කළ ප්‍රතිපාදන (Provisioíl Sum) තුළ රු. 800,000/- ලෙස ඇතුළත් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීමේ කාර්යය 2022.12.31 දින වන විට ද කොන්ත්‍රාත්කරු විසින් ඉටුකර ගෙන නොමැත. එබැවින් මෙම මුදල වන රු. 800,000/- ක මුදල කොන්ත්‍රාත්කරු වෙත 2022.12.31 දින වන විට ගෙවා නොතිබුණි.

3. **නොනිමි වැඩ**

	2022	2021
	රු.	රු.
විශ්වවිද්‍යාලයේ නව ගොඩනැගිලි සඳහා ව්‍යාපෘති සැලසුම් අනුමත කිරීම.		
● අනුරාධපුර මහනගර සභාව	-	149,472
● නාගරික සංවර්ධන අධිකාරිය	-	6,729,658
යෝජිත නේවාසිකාගාරය	-	11,424
යෝජිත සැලැස්ම (ඉදිකිරීම් ඉංජිනේරු සේවා සහ පොදු පහසුකම් අමාත්‍යාංශය)	-	31,055
ඉංජිනියරින් ඇන්ඩ් ලැබෝරටරි සර්විස්	-	124,040
ව්‍යාපෘති සැලසුම් 2017/2019	-	80,500
සංචාරක නිවාසය වැඩි දියුණු කිරීම	15,119,382	7,077,036
බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම	163,046,285	145,081,693
පරිගණක මෘදුකාංග පද්ධතිය	4,000,000	4,000,000
මහෝපාධ්‍යායය නිල නිවසේ තිර රෙදි සවිකිරීම	-	419,258
නව ඉඩමේ වැට ඉදිකිරීම	524,100	-
	182,689,767	**163,704,136**

4. ආයෝජන

	2022			2021		
<u>ස්ථාවර තැන්පතු</u>	**ජංගම නොවන**	**ජංගම**	**එකතුව**	**ජංගම නොවන**	**ජංගම**	**එකතුව**
	රු.	රු.	රු.	රු.	රු.	රු.
පර්යේෂණ අරමුදල	5,467,558	853,594	6,321,152	5,027,656	776,136	5,803,792
මහෝපාධ්‍යායය අරමුදල	4,922,105	2,011,551	6,933,656	5,944,387	610,765	6,555,152
ත්‍යාග අරමුදල් ආයෝජන	4,494,109	-	4,494,109	2,466,226	-	2,466,226
බාහිර පාඨමාලා, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල, පාඨමාලා සහ යටිතල පහසුකම් සංවර්ධන අරමුදල්	-	42,280,251	42,280,251	-	30,475,235	30,475,235
නේවාසිකාගාර ඇප ආයෝජන	1,925,368	545,385	2,470,753	1,501,799	500,843	2,002,642
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල	-	5,554,352	5,554,352	-	5,396,903	5,396,903
ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ අරමුදල	9,239,796		9,239,796	7,737,711	-	7,737,711
	26,048,936	**51,245,133**	**77,294,069**	**22,677,779**	**37,759,882**	**60,437,662**

4.1 කෙටිකාලීන ආයෝජන

<u>ස්ථාවර තැන්පතු - ජංගම</u>

	2022	2021
	රු.	රු.
මාස 3 ට වැඩි සහ වර්ෂ 1 ට අඩු	34,927,346	24,796,190
මාස 3 ට අඩු (මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වාර්තා කර ඇත.)	16,317,787	12,963,692
	51,245,133	**37,759,882**

4.2 ස්ථාවර තැන්පතුවල වෙනස් වීම.

	2022	2021
	රු.	රු.
වර්ෂයේ ආරම්භක ශේෂය	60,437,662	58,844,035
නව තැන්පතු	44,978,306	729,000
පොළී ප්‍රාග්ධනිත කිරීම හා ඉපයීම	4,161,343	4,009,313
ආපසු ගැනීම්	(32,283,242)	(3,144,686)
වර්ෂයේ අවසාන ශේෂය	**77,294,069**	**60,437,662**

4.3 ස්ථාවර තැන්පතු ආයෝජන - බැංකු අනුව

	2022	2021
	රු.	රු.
ලංකා බැංකුව	9,476,390	8,601,237
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	11,221,790	10,354,447
මහජන බැංකුව	43,723,668	30,695,920
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	620,555
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	12,872,221	10,165,503
	77,294,069	**60,437,662**

4.4 ඇතැම් ස්ථාවර තැන්පතු 2022.12.31 දී සිට වර්ෂයක් ඇතුලත කල් පිරුණ ද එම ස්ථාවර තැන්පතු කල්පිරීමේදී ආපසු ගැනීමේ පරමාර්ථයක් විශ්වවිද්‍යාලය හට නොමැති බැවින් සහ එම තැන්පතු ස්වයංක්‍රීයව අලුත්වන බැවින් එම ස්ථාවර තැන්පතු ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 76 (ඈ) වගන්තිය අනුව ජංගම නොවන කාණ්ඩයේ වර්ග කර ඇත.

5. තොගය

	2022	2021
	රු.	රු.
ලිපි ද්‍රව්‍ය	5,335,434	2,186,703
ගොඩනැගිලි ද්‍රව්‍ය	281,634	148,267
විදුලි උපකරණ	588,836	280,912
ජලනල	590,873	264,278
සනීපාරක්ෂක ද්‍රව්‍ය	86,736	21,279
	6,883,513	2,901,439
අඩු කළා : වෙන් කිරීම්	(310)	(3,990)
	6,883,203	**2,897,449**

6. අත්තිකාරම් සහ තැන්පතු

		2022	2021
		රු.	රු.
විදුලිය ඇප තැන්පත්		970,000	970,000
ඉදිකිරීම් ආරම්භක අත්තිකාරම්	6.1	43,139,715	53,873,564
		44,109,715	**54,843,564**

6.1 ඉදිකිරීම් ආරම්භක අත්තිකාරම්

	2022	2021
	රු.	රු.
සංචාරක නිවාසයේ දිගුවක් ඉදිකිරීම	-	3,547,309
බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම	43,139,715	50,326,255
	43,139,715	**53,873,564**

7. ලැබිය යුතු ශේෂ

		2022	2021
		රු.	රු.
ජංගම නොවන වත්කම්			
ණය හා අත්තිකාරම්	7.2	10,168,898	9,758,938
		10,168,898	**9,758,938**
විවිධ ණයගැතියෝ	7.1	2,759,985	1,266,876
ණය හා අත්තිකාරම්	7.2	4,193,587	3,982,810
ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොළිය	7.3	6,044,260	1,124,433
ආපදා ණය. පරිගණක ණය සඳහා ලැබිය යුතු පොළිය		-	
මහපොළ අරමුදලින් ලැබිය යුතු මුදල්		1,058,250	1,547,850
		14,056,082	**7,921,969**
එකතුව		**24,224,980**	**17,680,906**

7.1 විවිධ ණයගැතියෝ

	2022	2021
	රු.	රු.
මහෝපාධ්‍යායය අරමුදල	398,000	198,000
ත්‍යාග අරමුදල් ගිණුමෙන් ලැබිය යුතු මුදල්	160,200	160,200
වයි.කේ.ටී.බණ්ඩාර මයා	-	22,850
නේවාසිකාගාර කුලිය ඩී.එම්.පී.කේ.දිසානායක මයා	-	24,000
ශිෂ්‍ය හිමිවරුන්ගෙන් අයවිය යුතු මුදල්	303,979	-
සුගතදාස වික්‍රමසිංහ පුණ්‍ය අරමුදල් භාරය	1,622	-
එච්.එම්.ඩබ්.ආර්.හෙන්නායක මයා	-	871
රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	-	860,955
පූජ්‍ය අත්තරගොඩ පියධම්ම හිමි	638,171	-
සිරිදන්ත කන්ස්ට්‍රක්ෂන්ස්	1,251,968	-
ලැබිය යුතු PEO TV සම්බන්ධතා ගාස්තු	6,045	-
	2,759,985	**1,266,876**

7.2 ණය හා අත්තිකාරම්

	2022			2021		
	ජංගම නොවන	ජංගම	එකතුව	ජංගම නොවන	ජංගම	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
ප්‍රවාහන ණය	420,907	168,033	588,940	165,818	93,818	259,636
ආපදා ණය	8,759,055	3,580,587	12,339,642	8,708,296	3,539,142	12,247,438
පරිගණක ණය	366,318	183,300	549,618	319,521	128,721	448,242
යතුරුපැදි ණය	622,618	261,667	884,285	565,303	212,879	778,182
විශේෂ අත්තිකාරම්	-	-	-	-	2,000	2,000
උත්සව අත්තිකාරම්	-	-	-	-	6,250	6,250
	10,168,898	**4,193,587**	**14,362,485**	**9,758,938**	**3,982,810**	**13,741,748**

7.3 ස්ථාවර තැන්පතු/කාලීන තැන්පතු සඳහා ලැබිය යුතු පොළිය

	2022	2021
	රු.	රු.
ජාතික ඉතිරිකිරීමේ බැංකුව - ස්ථාවර තැන්පතු	328,337	107,710
මහජන බැංකුව -ස්ථාවර තැන්පතු	4,038,763	468,558
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව -ස්ථාවර තැන්පතු	967,563	185,180
ලංකා බැංකුව -ස්ථාවර තැන්පතු	709,597	281,778
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව -ස්ථාවර තැන්පතු	-	30,577
මහජන බැංකුව -Call Deposit	-	50,630
	6,044,260	**1,124,433**

8. ඉදිරියට කළ ගෙවීම්

	2022 රු.	2021 රු.
සාමාජික ගාස්තු-විදේශීය (කොමන් වෙල්ත් යුනිවර්සිටී)	349,294	212,449
ඡායා පිටපත් යන්ත්‍රය සඳහා සේවා ගාස්තු	11,717	17,326
විදුලි සෝපානය සඳහා සේවා ගාස්තු	239,148	49,924
වාහන වලට අදාල ආදායම් බලපත්‍ර, දුම් පරීක්ෂණ ගාස්තු සහ රක්ෂණ ගාස්තු	91,161	94,556
ඇගිලි සළකුණු යන්ත්‍රය සඳහා සේවා ගාස්තු	14,012	9,469
අභ්‍යන්තර දුරකථන පද්ධතිය සේවා ගාස්තු	14,003	11,669
මල අපද්‍රව්‍ය පද්ධතියේ සේවා ගාස්තු	81,453	489,924
පරිගණක ප්‍රතිවෛරස් මෘදුකාංගය	-	96,157
ජෙනරේටර් යන්ත්‍රය සඳහා සේවා ගාස්තු	65,078	-
	865,866	**981,474**

9. බැංකුවෙහි ඇති මුදල්

		2022 රු.	2021 රු.
Call deposit		-	1,000,000
ජංගම ගිණුම්	9.1	4,754,475	3,419,712
ඉතිරිකිරීමේ ගිණුම්	9.2	720,450	3,609,199
		5,474,925	**8,028,911**

9.1 ජංගම ගිණුම්

		2022 රු.	2021 රු.
පුනරාවර්තන	මහජන බැංකුව- අනුරාධපුර 008-1001-5001-4462	4,314,440	3,158,506
මූලධන	මහජන බැංකුව -අනුරාධපුර 008-1001-3001-4463	-	-
බාහිර පාඨමාලා අරමුදල්	මහජන බැංකුව -අනුරාධපුර 008-1001-7001-4461	440,035	261,206
		4,754,475	**3,419,712**

9.2 ඉතිරිකිරීමේ ගිණුම්

		2022 රු.	2021 රු.
10005-04-06732 ජාතික ඉතිරිකිරීමේ බැංකුව - අනුරාධපුර	පර්යේෂණ අරමුදල් ආයෝජන	2,180	2,112
10005-22-75368 ජාතික ඉතිරිකිරීමේ බැංකුව - අනුරාධපුර	පර්යේෂණ අරමුදල් ආයෝජන	1,674	1,621
10005-04-69971 ජාතික ඉතිරිකිරීමේ බැංකුව - අනුරාධපුර	නේවාසිකාගාර ඇප ආයෝජන	2,065	2,000
10005-04-13461 ජාතික ඉතිරිකිරීමේ බැංකුව - අනුරාධපුර	සංවර්ධන අරමුදල් ආයෝජන	3,135	3,036
10005-04-32369 ජාතික ඉතිරිකිරීමේ බැංකුව - අනුරාධපුර	ත්‍යාග අරමුදල ආයෝජන	85	85
008-200390079789 මහජන බැංකුව- අනුරාධපුර	ත්‍යාග අරමුදල ආයෝජන	52,592	14,194
008-200200079789 මහජන බැංකුව- අනුරාධපුර	ත්‍යාග අරමුදල ආයෝජන	92,252	2,938,065
10005-05-58591 ජාතික ඉතිරිකිරීමේ බැංකුව - අනුරාධපුර	මහෝපාධ්‍යාය අරමුදල ආයෝජන	1,773	1,717
008-200570079789 මහජන බැංකුව- අනුරාධපුර	ණය අරමුදල්	357,341	378,956
008-200480079789 මහජන බැංකුව- අනුරාධපුර	ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ ආයෝජන	201,313	267,413
008-2-002-0-0014463 මහජන බැංකුව- අනුරාධපුර	පොත් හා සඟරා අලෙවිකිරීම	6,040	-
		720,450	**3,609,199**

10. ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ සංචිත

	2022 රු.	2021 රු.
පූජ්‍ය පොල්පිටියේ ඤානරංසි හිමි	696,505	696,505
